# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2387/37 - 2024 ජූනි මස 06 වැනි බ්‍රහස්පතින්දා - 2024.06.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1963 අංක 11 දරන මුදල් පනත**

ජාතික ලොතරැයි මණ්ඩල රීති

1963 අංක 11 දරන මුදල් පනතේ 14 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය, 16 වැනි වගන්තිය සහ 20 වැනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ජාතික ලොතරැයි මණ්ඩලය විසින් සාදනු ලැබ, එම පනතේ 20 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද රීති.

**චමීර චන්ද්‍රාභය යාපා අබේවර්ධන,**
සභාපති / ප්‍රධාන විධායක නිලධාරී
ජාතික ලොතරැයි මණ්ඩලය.

2024 මැයි මස 21 වැනි දින,
කොළඹ දී ය

**රීති**

1. මෙම රීති 2023 අංක 1 දරන ජාතික ලොතරැයි මණ්ඩල රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ජාතික ලොතරැයි මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මුදල් පනතේ 14 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය ප්‍රකාර, පහත දැක්වෙන ජාතික ලොතරැයි මෙහෙයවනු ලැබිය යුතු යඃ-

   (අ) මහජන සම්පත;
   (ආ) ගොවිසෙත;
   (ඇ) මෙගා පවර්;
   (ඈ) ලකී 7 VIP ;
   (ඉ) NLB හඳහන;

(ඊ) ධන නිධානය;

(උ) NLB මෙගා මිලියන්ස්;

(ඌ) සෙවණ සූරන ලොතරැයිය; සහ

(එ) සමෘද්ධි සූරන ලොතරැයිය.

3. ජාතික ලොතරැයි මණ්ඩලය විසින්, ඉහත 2(අ) රීතියේ සඳහන් කර ඇති **මහජන සම්පත** ජාතික ලොතරැයිය, මෙහි පහත දැක්වෙන කොන්දේසි වලට යටත්ව මෙහෙයවනු ලැබිය යුතු ය :-

(1) සතියකට දිනුම් ඇදීම් හතක් සතියේ දින හතේ දී ම පවත්වනු ලැබිය යුතු ය.

(2) සෑම ටිකට්පතක් ම රුපියල් හතලිහකට (රු. 40/-) අලෙවි කරනු ලැබිය යුතු ය.

(3) සෑම ටිකට්පතක් ම එක් ත්‍යාගයක් පමණක් දිනා ගැනීමට සුදුසුකම් ලැබිය යුතුය.

(4) ටිකට්පත්වලට අංක යෙදීම 000000 අංකයේ සිට 999999 අංකය දක්වා විය යුතුය. සෑම ටිකට් පතක ම බිංදුවේ සිට නවය (0-9) දක්වා අංක 6 ක් සමග ඉංග්‍රීසි හෝඩියේ "අයි" අක්ෂරය හැර, "ඒ" සිට "ඉසෙඩ්" දක්වා ඉංග්‍රීසි අක්ෂර මුද්‍රණය කරනු ලැබ තිබිය යුතු ය. සෑම මුද්‍රිත ටිකට් පතක ම සම්මත අංක ආකෘතිය, තීරු කේත අංක ආකෘතිය සහ ක්ෂණික ප්‍රතිචාර කේත ආකෘතිය වශයෙන් ආකෘති තුනකින් අනුක්‍රමික අංකයක් ද අඩංගු විය යුතුය.

(5) ජයග්‍රහණය කරනු ලබන ටිකට්පත් නිශ්චය කිරීමේ කාර්යය සඳහා, ඉංග්‍රීසි හෝඩියේ "අයි" අක්ෂරය හැර, "ඒ" සිට "ඉසෙඩ්" දක්වා ඉංග්‍රීසි අක්ෂර අඩංගු බැරලයකින් ඉංග්‍රීසි අක්ෂරයක් දිනුම් අදිනු ලැබිය යුතු ය. ඊට අමතරව, බිංදුවේ සිට නවය (0-9) දක්වා අංක අඩංගු බැරල හයකින්, එක් බැරලයකින් එක් අංකය බැගින් අංක හයක් දිනුම් අදිනු ලැබිය යුතු ය. දිනුම් ඇදීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම භාවිත කරනු ලැබිය හැකි ය.

(6) ත්‍යාග ප්‍රදානය පහත දැක්වෙන විධිවිධාන අනුගමනය කරමින් සිදු කරනු ලැබිය යුතු ය :-

(අ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට පනහක ප්‍රතිශතයක් (50%) ත්‍යාග ප්‍රදානය සඳහා වෙන් කරනු ලැබිය යුතු ය;

(ආ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට විස්සක ප්‍රතිශතයක් (20%) නියෝජිත කොමිස් මුදල් සඳහා වෙන් කරනු ලැබිය යුතු ය. (ටිකට්පත් බෙදාහැරීමේ නියෝජිත සඳහා 1.25% ක කොමිස් මුදලක් සහ අලෙවි නියෝජිත සඳහා 18.75% ක කොමිස් මුදලක්) ;

(ඇ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට දහසයයි දශම පහක ප්‍රතිශතයක් (16.5%) ඒකාබද්ධ අරමුදල සඳහා වෙන් කරනු ලැබිය යුතුය;

(ඈ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට දහ තුනයි දශම පහක ප්‍රතිශතයක් (13.5%) ජාතික ලොතරැයි මණ්ඩලයෙහි 'මණ්ඩලයීය අරමුදල' සඳහා වෙන් කරනු ලැබිය යුතු ය;

(ඉ) ටිකට්පතක ඇති ඉංග්‍රීසි අක්ෂරය සහ අංක හය පිළිවෙලින් වමේ සිට දකුණට, දිනුම් අදින ලද ඉංග්‍රීසි අක්ෂරය සහ අංක හය සමග ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට්පතට රුපියල් මිලියන විස්සකට (රු. 20,000,000/-) නොඅඩු වන සුපිරි ත්‍යාගය ප්‍රදානය කරනු ලැබිය යුතුය;

(ඊ) ටිකට්පතක ඇති අංක හය පිළිවෙලින් වමේ සිට දකුණට, දිනුම් අදින ලද අංක හය සමග ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට්පතට රුපියල් මිලියන දෙකයි දශම පහක් (රු. 2,500,000/-) ප්‍රදානය කරනු ලැබිය යුතුය;

(උ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති අවසාන අංක පහ පිළිවෙලින් වමේ සිට දකුණට, දිනුම් අදින ලද අවසාන අංක පහ සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් එක් ලක්ෂයක් (රු. 100,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඌ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති අවසාන අංක හතර පිළිවෙලින් වමේ සිට දකුණට, දිනුම් අදින ලද අවසාන අංක හතර සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් පහලොස් දහසක් (රු. 15,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(එ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති අවසාන අංක තුන පිළිවෙලින් වමේ සිට දකුණට, දිනුම් අදින ලද අවසාන අංක තුන සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙදහසක් (රු. 2,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඒ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති අවසාන අංක දෙක පිළිවෙලින් වමේ සිට දකුණට, දිනුම් අදින ලද අවසාන අංක දෙක සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙසියයක් (රු. 200/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඔ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති අවසාන අංකය දිනුම් අදින ලද අවසාන අංකය සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හතළිහක් (රු. 40/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය;

(ඕ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති මුල් අංක පහ වමේ සිට දකුණට, පිළිවෙලින් දිනුම් අදින ලද මුල් අංක පහ සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් එක් ලක්ෂයක් (රු. 100,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ක) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති මුල් අංක හතර වමේ සිට දකුණට, පිළිවෙලින් දිනුම් අදින ලද මුල් අංක හතර සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙදහසක් (රු. 2,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ග) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති මුල් අංක තුන වමේ සිට දකුණට, පිළිවෙලින් දිනුම් අදින ලද මුල් අංක තුන සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙසියයක් (රු. 200/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ච) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති මුල් අංක දෙක වමේ සිට දකුණට, පිළිවෙලින් දිනුම් අදින ලද මුල් අංක දෙක සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් අසූවක් (රු. 80/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ජ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති මුල් අංකය දිනුම් අදින ලද මුල් අංකය සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හතළිහක් (රු. 40/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය;

(ට) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඉංග්‍රීසි අක්ෂරය දිනුම් අදින ලද ඉංග්‍රීසි අක්ෂරය සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හතළිහක් (රු. 40/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය;

(ඩ) ඒ අනුව ටිකට්පතේ පිටුපස දක්වා ඇති ත්‍යාග ව්‍යුහය පහත පරිදි වේ -

| ත්‍යාග ව්‍යුහය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය | දිනුම් අදින ලද අංකය | | | | | | වටිනාකම |
| සුපිරි ත්‍යාගය | Ⓧ | X | X | X | X | X | X | රු. 20,000,000/- |
| 1 ත්‍යාගය | O | X | X | X | X | X | X | රු.2,500,000/- බැගින් |
| 2 ත්‍යාගය | O | | X | X | X | X | X | රු. 100,000/- බැගින් |
| 3 ත්‍යාගය | O | | | X | X | X | X | රු. 15,000/- බැගින් |
| 4 ත්‍යාගය | O | | | | X | X | X | රු. 2,000/- බැගින් |
| 5 ත්‍යාගය | O | | | | | X | X | රු. 200/- බැගින් |
| 6 ත්‍යාගය | O | | | | | | X | රු. 40/- බැගින් |
| | | | | | | | | |
| 7 ත්‍යාගය | O | X | X | X | X | X | | රු. 100,000/- බැගින් |
| 8 ත්‍යාගය | O | X | X | X | X | | | රු. 2,000/- බැගින් |
| 9 ත්‍යාගය | O | X | X | X | | | | රු. 200/- බැගින් |
| 10 ත්‍යාගය | O | X | X | | | | | රු. 80/- බැගින් |
| 11 ත්‍යාගය | O | X | | | | | | රු. 40/- බැගින් |
| 12 ත්‍යාගය | X | | | | | | | රු. 40/- බැගින් |

(ත) මහජන සම්පත ලොතරැයියේ සුපිරි ත්‍යාගයේ වටිනාකම රුපියල් මිලියන විස්සකින් (රු. 20,000,000/-) ආරම්භ වනු ඇත ;

(ද) දැනට පවතින සුපිරි ත්‍යාගය ජයග්‍රහණය කරනු ලැබුවේ නම්, මහජන සම්පත ත්‍යාග සංචිත ගිණුම භාවිතා කරමින් රුපියල් මිලියන විස්සකින් (රු. 20,000,000/-) නව සුපිරි ත්‍යාගයක් ආරම්භ වනු ඇත;

(න) ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා වෙන් කර ඇති ටිකට්පත් අලෙවියෙන් ලද සියයට පනහක ප්‍රතිශතයෙන් (50%) යම් මුදලක් ඉතිරිව ඇති විටක දී, එකී ඉතිරිව ඇති මුදලින් (අතිරික්තය/ඉතිරිය) සියයට විස්සක (20%) ප්‍රතිශතයක් ඉදිරියට ගෙන යන සුපිරි ත්‍යාගයේ අගයට එකතු කරනු ලැබිය යුතු අතර, ඉතිරි සියයට අසූවේ ප්‍රතිශතය (80%) මුදල් පනතේ 17 වැනි වගන්තියේ (1අ) උපවගන්තියට අනුකූලව මහජන සම්පත ත්‍යාග සංචිත ගිණුමකට බැර කරනු ලැබිය යුතු ය;

(ප) යම් මහජන සම්පත ලොතරැයි දිනුම් ඇදීමක දී ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා වෙන් කරන ලද මුදල ජයග්‍රහණය කරන ලද මුළු ත්‍යාග සංඛ්‍යාව ප්‍රදානය කිරීම සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී මහජන සම්පත ත්‍යාග සංචිත ගිණුමේ ඇති මුදල් හෝ වෙනත් ඕනෑම ත්‍යාග සංචිත ගිණුමක ඇති මුදල් හිඟ මුදල සපුරාලීම සඳහා උපයෝගී කරගනු ලැබිය යුතු ය;

(බ) ජාතික ලොතරැයි මණ්ඩලයට අවශ්‍ය යැයි හැඟී ගියහොත්, ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන වෙනත් ජාතික ලොතරැයියක් සඳහා ත්‍යාග ලබා දීමට මහජන සම්පත ත්‍යාග සංචිත ගිණුමේ ඇති මුදල් උපයෝගී කර ගැනීමට හිමිකම තිබිය යුතු ය ; සහ

(ම) ඉහත ත්‍යාග ව්‍යුහය 2023 ජූලි මස 21 වැනි දිනට අදාළ දිනුම් ඇදීමේ අංකය 5182 සිට බලාත්මක වේ.

4. ජාතික ලොතරැයි මණ්ඩලය විසින්, ඉහත 2(ආ) රීතියේ සඳහන් කර ඇති ගොවිසෙත ජාතික ලොතරැයිය, මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව මෙහෙයවනු ලැබිය යුතු ය :-

(1) සතියකට දිනුම් ඇදීම් හතක්, සතියේ දින හතේ දී ම පවත්වනු ලැබිය යුතු ය.

(2) සෑම ටිකට්පතක් ම රුපියල් හතලිහකට (රු. 40/-) අලෙවි කරනු ලැබිය යුතු ය.

(3) සෑම ටිකට්පතක් ම එක් ත්‍යාගයක් පමණක් දිනා ගැනීමට සුදුසුකම් ලැබිය යුතුය.

(4) සෑම ටිකට්පතක ම එකේ සිට අසූව (1 - 80) දක්වා අංක අතරින් අංක හතරක් සමඟ ඉංග්‍රීසි හෝඩියේ "ඒ" සිට "ඉසෙඩ්" දක්වා ඉංග්‍රීසි අක්ෂර අතුරින් එක් ඉංග්‍රීසි අක්ෂරයක් මුද්‍රණය කරනු ලැබ තිබිය යුතු ය. සෑම මුද්‍රිත ටිකට්පතක ම සම්මත අංක ආකෘතිය, තීරු කේත අංක ආකෘතිය සහ ක්ෂණික ප්‍රතිචාර කේත ආකෘතිය වශයෙන් ආකෘති තුනකින් අනුක්‍රමික අංකයක් ද අඩංගු විය යුතු ය.

ජයග්‍රහණය කරනු ලබන ටිකට්පත් නිශ්චය කිරීමේ කාර්යය සඳහා, එකේ සිට අසූව (1 - 80) දක්වා වන අංක අඩංගු බැරලයකින් අංක හතරක් දිනුම් අදිනු ලැබිය යුතු ය. ඊට අමතරව, ඉංග්‍රීසි හෝඩියේ "ඒ" සිට "ඉසෙඩ්" දක්වා ඉංග්‍රීසි අක්ෂර අඩංගු බැරලයකින් එක් ඉංග්‍රීසි අක්ෂරයක් දිනුම් අදිනු ලැබිය යුතු ය. දිනුම් ඇදීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම භාවිත කරනු ලැබිය හැකි ය.

(5) ත්‍යාග ප්‍රදානය පහත දැක්වෙන විධිවිධාන අනුගමනය කරමින් සිදු කරනු ලැබිය යුතු යඃ-

(අ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට හතලිස් නවයක ප්‍රතිශතයක් (49%) ත්‍යාග ප්‍රදානය සඳහා වෙන් කරනු ලැබිය යුතු ය ;

(ආ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට විස්සක ප්‍රතිශතයක් (20%) නියෝජිත කොමිස් මුදල් සඳහා වෙන් කරනු ලැබිය යුතු ය. (ටිකට්පත් බෙදාහැරීමේ නියෝජිත සඳහා 1.25% ක කොමිස් මුදලක් සහ අලෙවි නියෝජිත සඳහා 18.75% ක කොමිස් මුදලක්) ;

(ඇ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට දහයක ප්‍රතිශතයක් (10%) ඒකාබද්ධ අරමුදල හරහා අදාළ අරමුදල සඳහා වෙන් කරනු ලැබිය යුතු ය;

(ඈ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට විසි එකක ප්‍රතිශතයක් (21%) ජාතික ලොතරැයි මණ්ඩලයෙහි 'මණ්ඩලයීය අරමුදල. සඳහා වෙන් කරනු ලැබිය යුතු ය ;

(ඉ) ටිකට්පතක ඇති අංක හතර සහ ඉංග්‍රීසි අක්ෂරය දිනුම් අදින ලද අංක හතර සහ ඉංග්‍රීසි අක්ෂරය සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට්පතට රුපියල් මිලියන හැටකට (රු. 60,000,000/-) නොඅඩු වන සුපිරි ත්‍යාගය ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඊ) ටිකට්පතක ඇති අංක හතර දිනුම් අදින ලද අංක හතර සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට්පතට රුපියල් මිලියන දෙකක් (රු. 2,000,000/-) ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(උ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම අංක තුනක් සහ ඉංග්‍රීසි අක්ෂරය දිනුම් අදින ලද ඕනෑම අංක තුනක් සහ ඉංග්‍රීසි අක්ෂරය සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙලක්ෂ පනස් දහසක් (රු. 250,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඌ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම අංක තුනක් දිනුම් අදින ලද ඕනෑම අංක තුනක් සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් පන් දහසක් (රු. 5,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(එ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම අංක දෙකක් සහ ඉංග්‍රීසි අක්ෂරය දිනුම් අදින ලද ඕනෑම අංක දෙකක් සහ ඉංග්‍රීසි අක්ෂරය සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙදහසක් (රු. 2,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඒ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම අංක දෙකක් දිනුම් අදින ලද ඕනෑම අංක දෙකක් සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙසියයක් (රු. 200/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඔ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම එක් අංකයක් සහ ඉංග්‍රීසි අක්ෂරය දිනුම් අදින ලද ඕනෑම එක් අංකයක් සහ ඉංග්‍රීසි අක්ෂරය සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙසියයක් (රු. 200/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඕ) ටිකට් පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම එක් අංකයක් දිනුම් අදින ලද ඕනෑම එක් අංකයක් සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට් පතට රුපියල් හතලිහක් (රු. 40/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ක) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඉංග්‍රීසි අක්ෂරය දිනුම් අදින ලද ඉංග්‍රීසි අක්ෂරය සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හතලිහක් (රු. 40/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ග) ඒ අනුව ටිකට්පතේ පිටුපස දක්වා ඇති ත්‍යාග ව්‍යුහය පහත පරිදි වේ -

| ත්‍යාග ව්‍යුහය | | | |
|---|---|---|---|
| සුපිරි ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය සහ අංක 4 ම නිවැරදි | රු. | 60,000,000/- |
| 1 ත්‍යාගය | අංක 4 ම නිවැරදි | රු. | 2,000,000/ බැගින් |
| 2 ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය සහ අංක 3 ක් නිවැරදි | රු. | 250,000/- බැගින් |
| 3 ත්‍යාගය | අංක 3 ක් නිවැරදි | රු. | 5,000/- බැගින් |
| 4 ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය සහ අංක 2 ක් නිවැරදි | රු. | 2,000/- බැගින් |
| 5 ත්‍යාගය | අංක 2 ක් නිවැරදි | රු. | 200/- බැගින් |
| 6 ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය සහ අංක 1 ක් නිවැරදි | රු. | 200/- බැගින් |
| 7 ත්‍යාගය | අංක 1 ක් නිවැරදි | රු. | 40/- බැගින් |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය නිවැරදි | රු. | 40/- බැගින් |

(ච) ගොවිසෙත ලොතරැයියේ සුපිරි ත්‍යාගයේ වටිනාකම රුපියල් මිලියන හැටකින් (රු. 60,000,000/-) ආරම්භ වනු ඇත ;

(ජ) දැනට පවතින සුපිරි ත්‍යාගය ජයග්‍රහණය කරනු ලැබුවේ නම්, ගොවිසෙත ත්‍යාග සංචිත ගිණුම භාවිතා කරමින් රුපියල් මිලියන හැටකින් (රු. 60,000,000/-) නව සුපිරි ත්‍යාගයක් ආරම්භ වනු ඇත;

(ට) ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා වෙන් කර ඇති ටිකට් පත් අලෙවියෙන් ලද සියයට හතලිස් නවයක ප්‍රතිශතයෙන් (49%) යම් මුදලක් ඉතිරිව ඇති විටක දී, එකී ඉතිරිව ඇති මුදලින් (අතිරික්තය / ඉතිරිය) සියයට දහයක (10%) ප්‍රතිශතයක් ඉදිරියට ගෙන යන සුපිරි ත්‍යාගයේ අගයට එකතු කරනු ලැබිය යුතු අතර, ඉතිරි සියයට අනූවේ ප්‍රතිශතය (90%) මුදල් පනතේ 17 වැනි වගන්තියේ (1අ) උපවගන්තියට අනුකූලව ගොවිසෙත ත්‍යාග සංචිත ගිණුමට බැර කරනු ලැබිය යුතු ය ;

(ඩ) යම් ගොවිසෙත ලොතරැයි දිනුම් ඇදීමක දී ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා වෙන් කරන ලද මුදල ජයග්‍රහණය කරන ලද මුළු ත්‍යාග සංඛ්‍යාව ප්‍රදානය කිරීම සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී ගොවිසෙත ත්‍යාග සංචිත ගිණුමේ ඇති මුදල් හෝ වෙනත් ඕනෑම ත්‍යාග සංචිත ගිණුමක ඇති මුදල් හිඟ මුදල සපුරාලීම සඳහා උපයෝගී කරගනු ලැබිය යුතු ය ;

(ත) ජාතික ලොතරැයි මණ්ඩලයට අවශ්‍ය යැයි හැඟී ගියහොත්, ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන වෙනත් ජාතික ලොතරැයියක් සඳහා ත්‍යාග ලබා දීමට ගොවිසෙත ත්‍යාග සංචිත ගිණුමේ ඇති මුදල් උපයෝගී කර ගැනීමට හිමිකම තිබිය යුතු ය ; සහ

(ද) ඉහත ත්‍යාග ව්‍යුහය 2023 ජූලි මස 6 වැනි දිනට අදාළ දිනුම් ඇදීමේ අංක 3409 සිට බලාත්මක වේ.

5. ජාතික ලොතරැයි මණ්ඩලය විසින්, ඉහත 2(ඇ) රීතියේ සඳහන් කර ඇති **මෙගා පවර්** ජාතික ලොතරැයිය (මින් පෙර 'පවර් ලොටෝ' නමින් මෙහෙයවනු ලැබ ඇත), මෙහි පහත දැක්වෙන කොන්දේසි වලට යටත්ව මෙහෙයවනු ලැබිය යුතු යඃ-

(1) සතියකට දිනුම් ඇදීම් හතක් සතියේ දින හතේ දී ම පවත්වනු ලැබිය යුතු ය.

(2) සෑම ටිකට්පතක් ම රුපියල් හතලිහකට (රු. 40/-) අලෙවි කරනු ලැබිය යුතු ය.

(3) සෑම ටිකට්පතක් ම එක් ත්‍යාගයක් පමණක් දිනා ගැනීමට සුදුසුකම් ලැබිය යුතු ය. කෙසේ වෙතත්, කිසියම් ජයග්‍රහණය කරන ලද ටිකට් පතක ඇති සුපිරි අංකය දිනුම් අදින ලද සුපිරි අංකය සමග ගැලපෙන අවස්ථාවක, එම ජයග්‍රහණය කරන ලද ටිකට්පතට අමතරව රුපියල් හතලිහක මුදලක් (රු. 40/-) ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

(4) සෑම ටිකට්පතක ම එකේ සිට විසි හය (1 - 26) දක්වා පරාසය තුළ සුපිරි අංකයක් සහ ඉංග්‍රීසි හෝඩියේ "ඒ" සිට "ඉසෙඩ්" දක්වා ඉංග්‍රීසි අක්ෂර වලින් එක් අක්ෂරයක් සහ එකේ සිට අසූව (1 - 80) දක්වා අංක පරාසය තුළ අංක හතරක් මුද්‍රණය කරනු ලැබ තිබිය යුතු ය. සෑම මුද්‍රිත ටිකට්පතක ම සම්මත අංක ආකෘතිය, තීරු කේත අංක ආකෘතිය සහ ක්ෂණික ප්‍රතිචාර කේත ආකෘතිය වශයෙන් ආකෘති තුනකින් අනුක්‍රමික අංකයක් ද අඩංගු විය යුතු ය.

(5) ජයග්‍රහණය කරනු ලබන ටිකට්පත් නිශ්චය කිරීමේ කාර්යය සඳහා, අදාළ අංක පරාසයන් තුළ අංක සඳහන් කරමින් වෙන් වූ බෝල කට්ටල දෙකක් ඇතුලත් කර වෙන් වෙන්ව සකස් කරනු ලැබූ බැරල් දෙකකින්, එකේ සිට අසූව (1 - 80) දක්වා වන අංක සඳහන් කර ඇති බෝලඅඩංගු බැරලයකින් අංක හතරක් සහ එකේ සිට විසි හය (1 - 26) දක්වා වන අංක සඳහන් කර ඇති බැරලයකින් සුපිරි අංකයක් දිනුම් අදිනු ලැබිය යුතු ය. ඊට අමතරව, ඉංග්‍රීසි හෝඩියේ "ඒ" සිට "ඉසෙඩ්" දක්වා ඉංග්‍රීසි අක්ෂර අඩංගු බැරලයකින් එක් ඉංග්‍රීසි අක්ෂරයක් දිනුම් අදිනු ලැබිය යුතු ය. දිනුම් ඇදීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම භාවිත කරනු ලැබිය හැකි ය.

(6) ත්‍යාග ප්‍රදානය පහත දැක්වෙන විධිවිධාන අනුගමනය කරමින් සිදු කරනු ලැබිය යුතු යඃ-

(අ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට පනහක ප්‍රතිශතයක් (50%) ත්‍යාග ප්‍රදානය සඳහා වෙන් කරනු ලැබිය යුතු ය ;

(ආ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට විස්සක ප්‍රතිශතයක් (20%) නියෝජිත කොමිස් මුදල් සඳහා වෙන් කරනු ලැබිය යුතු ය (ටිකට් පත් බෙදාහැරීමේ නියෝජිත සඳහා 1.25% ක කොමිස් මුදලක් සහ අලෙවි නියෝජිත සඳහා 18.75% ක කොමිස් මුදලක්) ;

(ඇ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට දහයක ප්‍රතිශතයක් (10%) ඒකාබද්ධ අරමුදල සඳහා වෙන් කරනු ලැබිය යුතු ය;

(ඈ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට විස්සක ප්‍රතිශතයක් (20%) ජාතික ලොතරැයි මණ්ඩලයෙහි 'මණ්ඩලයීය අරමුදල' සඳහා වෙන් කරනු ලැබිය යුතු ය ;

(ඉ) ටිකට්පතක ඇති අංක හතර, සුපිරි අංකය සහ ඉංග්‍රීසි අක්ෂරය දිනුම් අදින ලද අංක හතර, සුපිරි අංකය සහ ඉංග්‍රීසි අක්ෂරය සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට් පතට රුපියල් මිලියන එකසිය පනහක (රු. 150,000,000/-) නොඅඩු වන මෙගා සුපිරි ත්‍යාගය ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඊ) ටිකට්පතක ඇති අංක හතර සහ ඉංග්‍රීසි අක්ෂරය දිනුම් අදින ලද අංක හතර සහ ඉංග්‍රීසි අක්ෂරය සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට්පතට රුපියල් මිලියන දහයක (රු. 10,000,000/-) පවර් සුපිරි ත්‍යාගය ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(උ) ටිකට්පතක ඇති අංක හතර සහ සුපිරි අංකය දිනුම් අදින ලද අංක හතර සහ සුපිරි අංකය සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට්පතට රුපියල් මිලියන දහයක (රු. 10,000,000/-) ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඌ) ටිකට්පතක ඇති අංක හතර දිනුම් අදින ලද අංක හතර සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට්පතට රුපියල් මිලියන දෙකක් (රු. 2,000,000/-) ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(එ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම අංක තුනක් සහ ඉංග්‍රීසි අක්ෂරය දිනුම් අදින ලද ඕනෑම අංක තුනක් සහ ඉංග්‍රීසි අක්ෂරය සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් ලක්ෂ දෙකක් (රු. 200,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

(ඒ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම අංක තුනක් දිනුම් අදින ලද ඕනෑම අංක තුනක් සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් පන් දහසක් (රු. 5,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඔ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම අංක දෙකක් සහ ඉංග්‍රීසි අක්ෂරය දිනුම් අදින ලද ඕනෑම අංක දෙකක් සහ ඉංග්‍රීසි අක්ෂරය සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙදහසක් (රු. 2,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඕ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම අංක දෙකක් දිනුම් අදින ලද ඕනෑම අංක දෙකක් සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙසියයක් (රු. 200/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ක) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම එක් අංකයක් සහ ඉංග්‍රීසි අක්ෂරය දිනුම් අදින ලද ඕනෑම එක් අංකයක් සහ ඉංග්‍රීසි අක්ෂරය සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙසියයක් (රු. 200/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය

(ග) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම එක් අංකයක් දිනුම් අදින ලද ඕනෑම එක් අංකයක් සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හතලිහක් (රු. 40/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ච) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඉංග්‍රීසි අක්ෂරය දිනුම් අදින ලද ඉංග්‍රීසි අක්ෂරය සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හතලිහක් (රු. 40/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ජ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති සුපිරි අංකය දිනුම් අදින ලද සුපිරි අංකය සමඟ ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හතලිහක් (රු. 40/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ට) ඒ අනුව ටිකට්පතේ පිටුපස දක්වා ඇති ත්‍යාග ව්‍යුහය පහත පරිදි වේ -

| ත්‍යාග ව්‍යුහය | | |
|---|---|---|
| මෙගා සුපිරි ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය, සුපිරි අංකය සහ අංක 4 ම නිවැරදි | රු. 150,000,000/- |
| පවර් සුපිරි ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය සහ අංක 4 ම නිවැරදි | රු. 10,000,000/- |
| ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය | සුපිරි අංකය සහ අංක 4 ම නිවැරදි | රු. 10,000,000/- |
| 1 ත්‍යාගය | අංක 4 ම නිවැරදි | රු. 2,000,000/- බැගින් |
| 2 ත්‍යාගය | අංක 3 ක් සහ ඉංග්‍රීසි අක්ෂරය නිවැරදි | රු. 200,000/- බැගින් |
| 3 ත්‍යාගය | අංක 3 ක් නිවැරදි | රු. 5,000/- බැගින් |
| 4 ත්‍යාගය | අංක 2 ක් සහ ඉංග්‍රීසි අක්ෂරය නිවැරදි | රු. 2,000/- බැගින් |
| 5 ත්‍යාගය | අංක 2 ක් නිවැරදි | රු. 200/- බැගින් |
| 6 ත්‍යාගය | අංක 1 ක් සහ ඉංග්‍රීසි අක්ෂරය නිවැරදි | රු. 200/- බැගින් |
| 7 ත්‍යාගය | අංක 1 ක් නිවැරදි | රු. 40/- බැගින් |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය නිවැරදි | රු. 40/- බැගින් |
| 9 ත්‍යාගය | සුපිරි අංකය නිවැරදි | රු. 40/- බැගින් |

(ඩ) මෙගා පවර් ලොතරැයියේ මෙගා සුපිරි ත්‍යාගයේ වටිනාකම රුපියල් මිලියන එකසිය පනහකින් (රු. 150,000,000/-) ආරම්භ වනු ඇත ;

(ත) දැනට පවතින මෙගා සුපිරි ත්‍යාගය ජයග්‍රහණය කරනු ලැබුවේ නම්, මෙගා පවර් ත්‍යාග සංචිත ගිණුම භාවිතා කරමින් රුපියල් මිලියන එකසිය පනහකින් (රු. 150,000,000/-) නව මෙගා සුපිරි ත්‍යාගයක් ආරම්භ වනු ඇත;

(ද) මෙගා පවර් ලොතරැයියේ දැනට පවතින පවර් සුපිරි ත්‍යාගය ජයග්‍රහණය කරනු ලැබුවේ නම්, ත්‍යාග සංචිත ගිණුම භාවිතා කරමින් රුපියල් මිලියන දහයකින් (රු. 10,000,000/-) නව ස්ථාවර පවර් සුපිරි ත්‍යාගයක් ආරම්භ වනු ඇත;

(න) මෙගා පවර් ලොතරැයියේ දැනට පවතින ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගය ජයග්‍රහණය කරනු ලැබුවේ නම්, ත්‍යාග සංචිත ගිණුම භාවිතා කරමින් රුපියල් මිලියන දහයකින් (රු. 10,000,000/-) නව ස්ථාවර ග්‍රෑන්ඩ් සුපිරි ත්‍යාගයක් ආරම්භ වනු ඇත;

(ප) ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා වෙන් කර ඇති ටිකට් පත් අලෙවියෙන් ලද සියයට පනහක ප්‍රතිශතයෙන් (50%) යම් මුදලක් ඉතිරිව ඇති විටක දී, එකී ඉතිරිව ඇති මුදලින් (අතිරික්තය / ඉතිරිය) සියයට අනූවක ප්‍රතිශතය (90%) මුදල් පනතේ 17 වැනි වගන්තියේ (1අ) උපවගන්තියට අනුකූලව මෙගා පවර් ත්‍යාග සංචිත ගිණුමට බැර කරනු ලැබිය යුතු අතර ඉතිරි සියයට දහයක (10%) ප්‍රතිශතය (අතිරික්තය/ ඉතිරිය) ඉදිරියට ගෙන යන මෙගා සුපිරි ත්‍යාගයට එකතු කරනු ලැබිය යුතු ය ;

(බ) යම් මෙගා පවර් ලොතරැයි දිනුම් ඇදීමක දී ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා වෙන් කරන ලද මුදල ජයග්‍රහණය කරන ලද මුළු ත්‍යාග සංඛ්‍යාව ප්‍රදානය කිරීම සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී මෙගා පවර් ත්‍යාග සංචිත ගිණුමේ ඇති මුදල් හෝ වෙනත් ඕනෑම ත්‍යාග සංචිත ගිණුමක ඇති මුදල් හිඟ මුදල සපුරාලීම සඳහා උපයෝගී කරගනු ලැබිය යුතු ය ;

(ම) ජාතික ලොතරැයි මණ්ඩලයට අවශ්‍ය යැයි හැඟී ගියහොත්, ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන වෙනත් ජාතික ලොතරැයියක් සඳහා ත්‍යාග ලබා දීමට මෙගා පවර් ත්‍යාග සංචිත ගිණුමේ ඇති මුදල් උපයෝගී කර ගැනීමට හිමිකම තිබිය යුතු ය ; සහ

(ය) ඉහත ත්‍යාග ව්‍යුහය 2023 ජූලි මස 24 වැනි දිනට අදාළ දිනුම් ඇදීමේ අංකය 1533 සිට බලාත්මක වේ.

6. ජාතික ලොතරැයි මණ්ඩලය විසින්, ඉහත 2(ඇ) රීතියේ සඳහන් කර ඇති ලකී 7 VIP ජාතික ලොතරැයිය (මින් පෙර "ජාතික සම්පත" නමින් මෙහෙයවනු ලැබ ඇත) මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව මෙහෙයවනු ලැබිය යුතු යः-

(1) සතියකට දිනුම් ඇදීම් හතක් සතියේ දින හතේ දී ම පවත්වනු ලැබිය යුතු ය.

(2) සෑම ටිකට්පතක් ම රුපියල් හතලිහකට (රු. 40/-) අලෙවි කරනු ලැබිය යුතු ය.

(3) සෑම ටිකට්පතක් ම එක් ත්‍යාගයක් පමණක් දිනා ගැනීමට සුදුසුකම් ලැබිය යුතු ය.

(4) ටිකට්පත්වලට අංක යෙදීම 000000 අංකයේ සිට 999999 අංකය දක්වා විය යුතු ය. සෑම ටිකට් පතක ම බිංදුවේ සිට නවය (0-9) දක්වා අංක හයක් සහ ඉංග්‍රීසි හෝඩියේ "අයි" අක්ෂරය හැර, "ඒ" සිට "ඉසෙඩ්" දක්වා ඉංග්‍රීසි අක්ෂර මුද්‍රණය කරනු ලැබ තිබිය යුතු ය. සෑම මුද්‍රිත ටිකට්පතක ම සම්මත අංක ආකෘතිය, තීරු කේත අංක ආකෘතිය සහ ක්ෂණික ප්‍රතිචාර කේත ආකෘතිය වශයෙන් ආකෘති තුනකින් අනුක්‍රමික අංකයක් ද අඩංගු විය යුතු ය.

(5) ජයග්‍රහණය කරනු ලබන ටිකට්පත් නිශ්චය කිරීමේ කාර්යය සඳහා, ඉංග්‍රීසි හෝඩියේ "අයි" අක්ෂරය හැර, "ඒ" සිට "ඉසෙඩ්" දක්වා ඉංග්‍රීසි අක්ෂර අඩංගු බැරලයකින් ඉංග්‍රීසි අක්ෂරයක් දිනුම් අදිනු ලැබිය යුතු ය. ඊට අමතරව, බිංදුවේ සිට නවය (0-9) දක්වා අංක අඩංගු බැරල හයකින්, එක් බැරලයකින් එක් අංකය බැගින් අංක හයක් දිනුම් අදිනු ලැබිය යුතු ය. දිනුම් ඇදීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම භාවිත කරනු ලැබිය හැකි ය.

(6) ත්‍යාග ප්‍රදානය පහත දැක්වෙන විධිවිධාන අනුගමනය කරමින් සිදු කරනු ලැබිය යුතු යඃ-

(අ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට පනස් හතක ප්‍රතිශතයක් (57%) ත්‍යාග ප්‍රදානය සඳහා වෙන් කරනු ලැබිය යුතු ය ;

(ආ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට විස්සක ප්‍රතිශතයක් (20%) නියෝජිත කොමිස් මුදල් සඳහා වෙන් කරනු ලැබිය යුතු ය (ටිකට්පත් බෙදාහැරීමේ නියෝජිත සඳහා 1.25% ක කොමිස් මුදලක් සහ අලෙවි නියෝජිත සඳහා 18.75% ක කොමිස් මුදලක්) ;

(ඇ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට දහයක ප්‍රතිශතයක් (10%) ඒකාබද්ධ අරමුදල සහ අනෙකුත් අරමුදල් සඳහා වෙන් කරනු ලැබිය යුතු ය ;

(ඈ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට දහ තුනක ප්‍රතිශතයක් (13%) ජාතික ලොතරැයි මණ්ඩලයෙහි "මණ්ඩලයීය අරමුදල" සඳහා වෙන් කරනු ලැබිය යුතු ය ;

(ඉ) ටිකට්පතක ඇති ඉංග්‍රීසි අක්ෂරය සහ අංක හය දිනුම් අදින ලද ඉංග්‍රීසි අක්ෂරය සහ අංක හය සමග ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට්පතට රුපියල් මිලියන විස්සකට (රු. 20,000,000/-) නොඅඩු වන සුපිරි ත්‍යාගය ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඊ) ටිකට්පතක ඇති අංක හය දිනුම් අදින ලද අංක හය වමේ සිට දකුණට පිළිවෙලින් ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට්පතට රුපියල් මිලියන දෙකයි දශම පහක් (රු. 2,500,000/-) ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(උ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති අවසාන අංක පහ පිළිවෙලින් වමේ සිට දකුණට, දිනුම් අදින ලද අවසාන අංක පහ සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙලක්ෂ පනස් දහසක් (රු. 250,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඌ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති අවසාන අංක හතර පිළිවෙලින් වමේ සිට දකුණට, දිනුම් අදින ලද අවසාන අංක හතර සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් විසි දහසක් (රු. 20,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(එ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති අවසාන අංක තුන පිළිවෙලින් වමේ සිට දකුණට, දිනුම් අදින ලද අවසාන අංක තුන සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙදහසක් (රු. 2,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඒ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති අවසාන අංක දෙක පිළිවෙලින් වමේ සිට දකුණට, දිනුම් අදින ලද අවසාන අංක දෙක සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙසියයක් (රු. 200/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඔ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති අවසාන අංකය දිනුම් අදින ලද අවසාන අංකය සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හතලිහක් (රු. 40/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඕ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති මුල් අංක පහ වමේ සිට දකුණට, පිළිවෙලින් දිනුම් අදින ලද මුල් අංක පහ සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් එක් ලක්ෂයක් (රු. 100,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ක) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති මුල් අංක හතර වමේ සිට දකුණට, පිළිවෙලින් දිනුම් අදින ලද මුල් අංක හතර සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හාරදහසක් (රු. 4,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ග) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති මුල් අංක තුන වමේ සිට දකුණට, පිළිවෙලින් දිනුම් අදින ලද මුල් අංක තුන සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් පන්සියයක් (රු. 500/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ච) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති මුල් අංක දෙක වමේ සිට දකුණට පිළිවෙලින් දිනුම් අදින ලද මුල් අංක දෙක සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් එකසිය විස්සක් (රු. 120/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ජ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති මුල් අංකය දිනුම් අදින ලද මුල් අංකය සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හතළිහක් (රු. 40/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ට) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඉංග්‍රීසි අක්ෂරය දිනුම් අදින ලද ඉංග්‍රීසි අක්ෂරය සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හතළිහක් (රු. 40/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඩ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති අංක හය දිනුම් අදින ලද අංක හය සමග (ඕනෑම පිළිවෙලකට) ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට්පතට රුපියල් පන්සියයක් (රු. 500/-) ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ත) ඒ අනුව ටිකට්පතේ පිටුපස දක්වා ඇති ත්‍යාග ව්‍යුහය පහත පරිදි වේ -

| ත්‍යාග ව්‍යුහය | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය | දිනුම් අදින ලද අංකය | | | | | | වටිනාකම |
| සුපිරි ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය | X | X | X | X | X | X | රු. 20,000,000/- |
| 1 ත්‍යාගය | | X | X | X | X | X | X | රු.2,500,000/- බැගින් |
| 2 ත්‍යාගය | | | X | X | X | X | X | රු. 250,000/- බැගින් |
| 3 ත්‍යාගය | | | | X | X | X | X | රු. 20,000/- බැගින් |
| 4 ත්‍යාගය | | | | | X | X | X | රු. 2,000/- බැගින් |
| 5 ත්‍යාගය | | | | | | X | X | රු. 200/- බැගින් |
| 6 ත්‍යාගය | | | | | | | X | රු. 40/- බැගින් |
| | | | | | | | | |
| 7 ත්‍යාගය | | X | X | X | X | X | | රු. 100,000/- බැගින් |
| 8 ත්‍යාගය | | X | X | X | X | | | රු. 4,000/- බැගින් |
| 9 ත්‍යාගය | | X | X | X | | | | රු. 500/- බැගින් |
| 10 ත්‍යාගය | | X | X | | | | | රු. 120/- බැගින් |
| 11 ත්‍යාගය | | X | | | | | | රු. 40/- බැගින් |
| 12 ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය | | | | | | | රු. 40/- බැගින් |
| 13 ත්‍යාගය | ජයග්‍රාහී අංක 6 ඕනෑම පිළිවෙලකට ගැලපීම | | | | | | | රු. 500/- බැගින් |

(ද) ලකී 7 VIP ලොතරැයියේ සුපිරි ත්‍යාගයේ වටිනාකම රුපියල් මිලියන විස්සකින් (රු. 20,000,000/-) ආරම්භ වනු ඇත ;

(න) දැනට පවතින සුපිරි ත්‍යාගය ජයග්‍රහණය කරනු ලැබුවේ නම්, ලකී 7 VIP ත්‍යාග සංචිත ගිණුම භාවිතා කරමින් රුපියල් මිලියන විස්සකින් (රු. 20,000,000/-) නව සුපිරි ත්‍යාගයක් ආරම්භ වනු ඇත ;

(ප) ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා වෙන් කර ඇති ටිකට් පත් අලෙවියෙන් ලද සියයට පනස් හතක ප්‍රතිශතයෙන් (57%) යම් මුදලක් ඉතිරිව ඇති විටක දී, එකී ඉතිරිව ඇති මුදලින් (අතිරික්තය / ඉතිරිය) සියයට දහයක (10%) ප්‍රතිශතයක් ඉදිරියට ගෙන යන සුපිරි ත්‍යාගයේ අගයට එකතු කරනු ලැබිය යුතු අතර, ඉතිරි සියයට අනූවේ ප්‍රතිශතය (90%) මුදල් පනතේ 17 වැනි වගන්තියේ (1අ) උපවගන්තියට අනුකූලව ලකී 7 VIP ත්‍යාග සංචිත ගිණුමට බැර කරනු ලැබිය යුතු ය ;

(බ) යම් ලකී 7 VIP ලොතරැයි දිනුම් ඇදීමක දී ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා වෙන් කරන ලද මුදල ජයග්‍රහණය කරන ලද මුළු ත්‍යාග සංඛ්‍යාව ප්‍රදානය කිරීම සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී ලකී 7 VIP ත්‍යාග සංචිත ගිණුමේ ඇති මුදල් හෝ වෙනත් ඕනෑම ත්‍යාග සංචිත ගිණුමක ඇති මුදල් හිඟ මුදල සපුරාලීම සඳහා උපයෝගී කරගනු ලැබිය යුතු ය ;

(ම) ජාතික ලොතරැයි මණ්ඩලයට අවශ්‍ය යැයි හැඟී ගියහොත්, ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන වෙනත් ජාතික ලොතරැයියක් සඳහා ත්‍යාග ලබා දීමට ලකී 7 VIP සංචිත ගිණුමේ ඇති මුදල් උපයෝගී කර ගැනීමට හිමිකම තිබිය යුතු ය ; සහ

(ය) ඉහත ත්‍යාග ව්‍යුහය 2023 නොවැම්බර් මස 22 වැනි දිනට අදාළ දිනුම් ඇදීමේ අංක 132 සිට බලාත්මක වේ.

7. ජාතික ලොතරැයි මණ්ඩලය විසින්, ඉහත 2(ඉ) රීතියේ සඳහන් කර ඇති NLB හඳහන ජාතික ලොතරැයිය (මීන් පෙර "සුපිරි වාසනා" නමින් මෙහෙයවනු ලැබ ඇත) මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව මෙහෙයවනු ලැබිය යුතු යː-

(1) සතියකට දිනුම් ඇදීම් හතක් සතියේ දින හතේ දී ම පවත්වනු ලැබිය යුතු ය.

(2) සෑම ටිකට්පතක් ම රුපියල් හතලිහකට (රු. 40/-) අලෙවි කරනු ලැබිය යුතු ය.

(3) සෑම ටිකට්පතක් ම එක් ත්‍යාගයක් පමණක් දිනා ගැනීමට සුදුසුකම් ලැබිය යුතු ය.

(4) සෑම ටිකට්පතකම ලග්න සංකේත දොළහෙන් (12) එක් ලග්න සංකේතයක් සහ එකේ සිට හැට දෙක දක්වා (1 - 62) පරාසය තුළ අංක හතරක් මුද්‍රණය කරනු ලැබ තිබිය යුතු ය. සෑම මුද්‍රිත ටිකට්පතක ම සම්මත අංක ආකෘතිය, තීරු කේත අංක ආකෘතිය සහ ක්ෂණික ප්‍රතිචාර කේත ආකෘතිය වශයෙන් ආකෘති තුනකින් අනුක්‍රමික අංකයක් ද අඩංගු විය යුතු ය.

(5) ජයග්‍රහණය කරනු ලබන ටිකට්පත් නිශ්චය කිරීමේ කාර්යය සඳහා, එකේ සිට හැට දෙක (1 - 62) දක්වා වන අංක අඩංගු බැරලයකින් අංක හතරක් සහ ලග්න සංකේත දොළහක් (12) අඩංගු බැරලයකින් එක් ලග්න සංකේතයක් දිනුම් අදිනු ලැබිය යුතු ය. දිනුම් ඇදීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම භාවිත කරනු ලැබිය හැකිය.

(6) ත්‍යාග ප්‍රදානය පහත දැක්වෙන විධිවිධාන අනුගමනය කරමින් සිදු කරනු ලැබිය යුතු ය ඃ-

(අ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට පනස් තුනක ප්‍රතිශතයක් (53%) ත්‍යාග ප්‍රදානය සඳහා වෙන් කරනු ලැබිය යුතු ය ;

(ආ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට විස්සක ප්‍රතිශතයක් (20%) නියෝජිත කොමිස් මුදල් සඳහා වෙන් කරනු ලැබිය යුතු ය (ටිකට්පත් බෙදාහැරීමේ නියෝජිත සඳහා 1.25% ක කොමිස් මුදලක් සහ අලෙවි නියෝජිත සඳහා 18.75% ක කොමිස් මුදලක්) ;

(ඇ) ටිකට් පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට දහයක ප්‍රතිශතයක් (10%) ඒකාබද්ධ අරමුදල හරහා වෙනත් අරමුදල් සඳහා වෙන් කරනු ලැබිය යුතු ය ;

(ඈ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට දහ හතක ප්‍රතිශතයක් (17%) ජාතික ලොතරැයි මණ්ඩලයෙහි 'මණ්ඩලයීය අරමුදල' සඳහා වෙන් කරනු ලැබිය යුතු ය ;

(ඉ) ටිකට්පතක ඇති ලග්න සංකේතය සහ අංක හතර දිනුම් අදින ලද ලග්න සංකේතය සහ අංක හතර සමග ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට්පතට රුපියල් මිලියන තුනකට (රු. 3,000,000/) නොඅඩු වන සුපිරි ත්‍යාගය ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඊ) ටිකට්පතක ඇති අංක හතර දිනුම් අදින ලද අංක හතර සමග ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට්පතට රුපියල් මිලියන එකක් (රු. 1,000,000/-) ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(උ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ලග්න සංකේතය සහ ඕනෑම අංක තුනක් දිනුම් අදින ලද ලග්න සංකේතය සහ ඕනෑම අංක තුනක් සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් විසි පන්දහසක් (රු. 25,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඌ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම අංක තුනක් දිනුම් අදින ලද ඕනෑම අංක තුනක් සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙදහසක් (රු. 2,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(එ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ලග්න සංකේතය සහ ඕනෑම අංක දෙකක් දිනුම් අදින ලද ලග්න සංකේතය සහ ඕනෑම අංක දෙකක් සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් පන්සියයක් (රු. 500/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඒ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම අංක දෙකක් දිනුම් අදින ලද ඕනෑම අංක දෙකක් සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙසියයක් (රු. 200/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඔ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ලග්න සංකේතය සහ ඕනෑම එක් අංකයක් දිනුම් අදින ලග්න සංකේතය සහ ඕනෑම එක් අංකයක් සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් එකසිය විස්සක් (රු. 120/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඕ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම එක් අංකයක් දිනුම් අදින ලද ඕනෑම එක් අංකයක් සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හතලිහක් (රු. 40/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ක) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ලග්න සංකේතය දිනුම් අදින ලද ලග්න සංකේතය සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හතලිහක් (රු. 40/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ග) ඒ අනුව ටිකට්පතේ පිටුපස දක්වා ඇති ත්‍යාග ව්‍යුහය පහත පරිදි වේ -

| ත්‍යාග ව්‍යුහය | | | | |
|---|---|---|---|---|
| සුපිරි ත්‍යාගය | ලග්න සංකේතය සහ අංක 4 ම නිවැරදි | රු. | 3,000,000/- | |
| 1 ත්‍යාගය | අංක 4 ම නිවැරදි | රු. | 1,000,000/- | බැගින් |
| 2 ත්‍යාගය | අංක 3 ක් සහ ලග්න සංකේතය නිවැරදි | රු. | 25,000/- | බැගින් |
| 3 ත්‍යාගය | අංක 3 ක් නිවැරදි | රු. | 2,000/- | බැගින් |
| 4 ත්‍යාගය | අංක 2 ක් සහ ලග්න සංකේතය නිවැරදි | රු. | 500/- | බැගින් |
| 5 ත්‍යාගය | අංක 2 ක් නිවැරදි | රු. | 200/- | බැගින් |
| 6 ත්‍යාගය | අංක 1 ක් සහ ලග්න සංකේතය නිවැරදි | රු. | 120/- | බැගින් |
| 7 ත්‍යාගය | අංක 1 ක් නිවැරදි | රු. | 40/- | බැගින් |
| 8 ත්‍යාගය | ලග්න සංකේතය නිවැරදි | රු. | 40/- | බැගින් |

(ච) හඳහන ලොතරැයියේ සුපිරි ත්‍යාගයේ වටිනාකම රුපියල් මිලියන තුනකින් (රු. 3,000,000/-) ආරම්භ වනු ඇත ;

(ජ) දැනට පවතින සුපිරි ත්‍යාගය ජයග්‍රහණය කරනු ලැබුවේ නම්, NLB හඳහන ත්‍යාග සංචිත ගිණුම භාවිතා කරමින් රුපියල් මිලියන තුනකින් (රු. 3,000,000/-) නව සුපිරි ත්‍යාගයක් ආරම්භ වනු ඇත;

(ට) ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා වෙන් කර ඇති ටිකට් පත් අලෙවියෙන් ලද සියයට පනස් තුනක ප්‍රතිශතයෙන් (53%) යම් මුදලක් ඉතිරිව ඇති විටක දී, එකී ඉතිරිව ඇති මුදලින් (අතිරික්තය / ඉතිරිය) සියයට දහයක (10%) ප්‍රතිශතයක්, ඉදිරියට ගෙන යන සුපිරි ත්‍යාගයේ අගයට එකතු කරනු ලැබිය යුතු අතර, ඉතිරි සියයට අනූවේ ප්‍රතිශතය (90%) මුදල් පනතේ 17 වැනි වගන්තියේ (1අ) උපවගන්තියට අනුකූලව NLB හඳහන ත්‍යාග සංචිත ගිණුමට බැර කරනු ලැබිය යුතු ය ;

(ඩ) යම් NLB හඳහන ලොතරැයි දිනුම් ඇදීමක දී ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා වෙන් කරන ලද මුදල ජයග්‍රහණය කරන ලද මුළු ත්‍යාග සංඛ්‍යාව ප්‍රදානය කිරීම සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී NLB හඳහන ත්‍යාග සංචිත ගිණුමේ ඇති මුදල් හෝ වෙනත් ඕනෑම ත්‍යාග සංචිත ගිණුමක ඇති මුදල් හිඟ මුදල සපුරාලීම සඳහා උපයෝගී කරගනු ලැබිය යුතු ය ;

(ත) ජාතික ලොතරැයි මණ්ඩලයට අවශ්‍ය යැයි හැඟී ගියහොත්, ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන වෙනත් ජාතික ලොතරැයියක් සඳහා ත්‍යාග ලබා දීමට NLB හඳහන ත්‍යාග සංචිත ගිණුමේ ඇති මුදල් උපයෝගී කර ගැනීමට හිමිකම තිබිය යුතු ය ; සහ

(ද) ඉහත ත්‍යාග ව්‍යුහය 2023 සැප්තැම්බර් මස 3 වැනි දිනට අදාළ දිනුම් ඇදීමේ අංක 535 සිට බලාත්මක වේ.

8. ජාතික ලොතරැයි මණ්ඩලය විසින්, ඉහත 2(ඊ) රීතියේ සඳහන් කර ඇති ධන නිධානය ජාතික ලොතරැයිය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව මෙහෙයවනු ලැබිය යුතු යः-

(1) සතියකට දිනුම් ඇදීම් හතක් සතියේ දින හතේ දී ම පවත්වනු ලැබිය යුතු ය.

(2) සෑම ටිකට්පතක් ම රුපියල් හතළිහකට (රු. 40/-) අලෙවි කරනු ලැබිය යුතු ය.

(3) සෑම ටිකට්පතක් ම එක් ත්‍යාගයක් පමණක් දිනා ගැනීමට සුදුසුකම් ලැබිය යුතු ය. කෙසේ වෙතත්, කිසියම් ජයග්‍රහණය කරන ලද ටිකට්පතක ඇති අතිරේක අක්ෂරය දිනුම් අදින ලද අක්ෂරය සමග ගැලපෙන අවස්ථාවක, එම ජයග්‍රහණය කරන ලද ටිකට් පතට අමතරව රුපියල් හතළිහක මුදලක් (රු. 40/-) ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

(4) සෑම ටිකට්පතක ම එකේ සිට අසූ දෙක (1 - 82) දක්වා අංක අතරින් අංක හතරක් සහ ඉංග්‍රීසි හෝඩියේ "ඒ" සිට "ඉසෙඩ්" දක්වා ඉංග්‍රීසි අක්ෂර මුද්‍රණය කරනු ලැබ තිබිය යුතු ය. සෑම මුද්‍රිත ටිකට්පතක ම සම්මත අංක ආකෘතිය, තීරු කේත අංක ආකෘතිය සහ ක්ෂණික ප්‍රතිචාර කේත ආකෘතිය වශයෙන් ආකෘති තුනකින් අනුක්‍රමික අංකයක් ද අඩංගු විය යුතු ය.

(5) ජයග්‍රහණය කරනු ලබන ටිකට්පත් නිශ්චය කිරීමේ කාර්යය සඳහා, එකේ සිට අසූ දෙක (1 - 82) දක්වා වන අංක අඩංගු බැරලයකින් අංක හතරක් සහ ඉංග්‍රීසි හෝඩියේ "ඒ" සිට "ඉසෙඩ්" දක්වා ඉංග්‍රීසි අක්ෂර අඩංගු බැරලයකින් එක් ඉංග්‍රීසි අක්ෂරයක් දිනුම් අදිනු ලැබිය යුතු ය. දිනුම් ඇදීම සඳහා නවීන තාක්ෂණික ක්‍රම භාවිතා කරනු ලැබිය හැකි ය.

(6) ත්‍යාග ප්‍රදානය පහත දැක්වෙන විධිවිධාන අනුගමනය කරමින් සිදු කරනු ලැබිය යුතු යः-

(අ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට හතළිස් නවයක ප්‍රතිශතයක් (49%) ත්‍යාග ප්‍රදානය සඳහා වෙන් කරනු ලැබිය යුතු ය ;

(ආ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට විස්සක ප්‍රතිශතයක් (20%) නියෝජිත කොමිස් මුදල් සඳහා වෙන් කරනු ලැබිය යුතු ය. (ටිකට්පත් බෙදාහැරීමේ නියෝජිත සඳහා 1.25% ක කොමිස් මුදලක් සහ අලෙවි නියෝජිත සඳහා 18.75% ක කොමිස් මුදලක්) ;

(ඇ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට දහයක ප්‍රතිශතයක් (10%) ඒකාබද්ධ අරමුදල සඳහා වෙන් කරනු ලැබිය යුතු ය ;

(ඈ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට විසි එකක ප්‍රතිශතයක් (21%) ජාතික ලොතරැයි මණ්ඩලයෙහි 'මණ්ඩලයීය අරමුදල' සඳහා වෙන් කරනු ලැබිය යුතු ය ;

(ඉ) ටිකට්පතක ඇති ඉංග්‍රීසි අක්ෂරය සහ අංක හතර දිනුම් අදින ලද ඉංග්‍රීසි අක්ෂරය සහ අංක හතර සමග ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට්පතට රුපියල් මිලියන අසූවකට (රු. 80,000,000/-) නොඅඩු වන සුපිරි ත්‍යාගය ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඊ) ටිකට්පතක ඇති අංක හතර දිනුම් අදින ලද අංක හතර සමග ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට්පතට රුපියල් මිලියන දෙකක් (රු. 2,000,000/-) ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(උ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඉංග්‍රීසි අක්ෂරය සහ ඕනෑම අංක තුනක් දිනුම් අදින ලද ඉංග්‍රීසි අක්ෂරය සහ ඕනෑම අංක තුනක් සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් ලක්ෂ දෙකක් (රු. 200,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඌ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම අංක තුනක් දිනුම් අදින ලද ඕනෑම අංක තුනක් සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හය දහසක් (රු. 6,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(එ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඉංග්‍රීසි අක්ෂරය සහ ඕනෑම අංක දෙකක් දිනුම් අදින ලද ඉංග්‍රීසි අක්ෂරය සහ ඕනෑම අංක දෙකක් සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙදහසක් (රු. 2,000/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඒ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම අංක දෙකක් දිනුම් අදින ලද ඕනෑම අංක දෙකක් සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් දෙසියයක් (රු. 200/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඔ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඉංග්‍රීසි අක්ෂරය සහ ඕනෑම එක් අංකයක් දිනුම් අදින ලද ඉංග්‍රීසි අක්ෂරය සහ ඕනෑම එක් අංකයක් සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් එකසිය විස්සක් (රු. 120/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඕ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඕනෑම එක් අංකයක් දිනුම් අදින ලද ඕනෑම එක් අංකයක් සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හතලිහක් (රු. 40/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ක) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති ඉංග්‍රීසි අක්ෂරය දිනුම් අදින ලද ඉංග්‍රීසි අක්ෂරය සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හතලිහක් (රු. 40/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ග) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති අතිරේක අක්ෂරය දිනුම් අදින ලද අක්ෂරය සමග ගැලපෙන අවස්ථාවක දී, එම එක් එක් ටිකට්පතට රුපියල් හතලිහක් (රු. 40/-) බැගින් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ච) ඒ අනුව ටිකට්පතේ පිටුපස දක්වා ඇති ත්‍යාග ව්‍යුහය පහත පරිදි වේ -

| ත්‍යාග ව්‍යුහය | | | | |
|---|---|---|---|---|
| සුපිරි ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය සහ අංක 4 ම නිවැරදි | රු. | 80,000,000/- | |
| 1 ත්‍යාගය | අංක 4 ක් නිවැරදි | රු. | 2,000,000/- | බැගින් |
| 2 ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය සහ අංක 3 ක් නිවැරදි | රු. | 200,000/- | බැගින් |
| 3 ත්‍යාගය | අංක 3 ක් නිවැරදි | රු. | 6,000/- | බැගින් |
| 4 ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය සහ අංක 2 ක් නිවැරදි | රු. | 2,000/- | බැගින් |
| 5 ත්‍යාගය | අංක 2 ක් නිවැරදි | රු. | 200/- | බැගින් |
| 6 ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය සහ අංක 1 ක් නිවැරදි | රු. | 120/- | බැගින් |
| 7 ත්‍යාගය | අංක 1 ක් නිවැරදි | රු. | 40/- | බැගින් |
| 8 ත්‍යාගය | ඉංග්‍රීසි අක්ෂරය නිවැරදි | රු. | 40/- | බැගින් |
| 9 ත්‍යාගය | අතිරේක අක්ෂරය | රු. | 40/- | බැගින් |

(ජ) ධන නිධානය ලොතරැයියේ සුපිරි ත්‍යාගයේ වටිනාකම රුපියල් මිලියන අසූවකින් (රු. 80,000,000/-) ආරම්භ වනු ඇත ;

(ට) දැනට පවතින සුපිරි ත්‍යාගය ජයග්‍රහණය කරනු ලැබුවේ නම්, ධන නිධානය ත්‍යාග සංචිත ගිණුම භාවිතා කරමින් රුපියල් මිලියන අසූවකින් (රු. 80,000,000/-) නව සුපිරි ත්‍යාගයක් ආරම්භ වනු ඇත;

(ඩ) ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා වෙන් කර ඇති ටිකට්පත් අලෙවියෙන් ලද සියයට හතලිස් නවයක ප්‍රතිශතයෙන් (49%) යම් මුදලක් ඉතිරිව ඇති විටක දී, එකී ඉතිරිව ඇති මුදලින් (අතිරික්තය / ඉතිරිය) සියයට විස්සක (20%) ප්‍රතිශතයක්

ඉදිරියට ගෙන යන සුපිරි ත්‍යාගයේ අගයට එකතු කරනු ලැබිය යුතු අතර, ඉතිරි සියයට අසූවේ ප්‍රතිශතය (80%) මුදල් පනතේ 17 වැනි වගන්තියේ (1අ) උපවගන්තියට අනුකූලව ධන නිධානය ත්‍යාග සංචිත ගිණුමට බැර කරනු ලැබිය යුතු ය ;

(ත) යම් ධන නිධානය ලොතරැයි දිනුම් ඇදීමක දී ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා වෙන් කරන ලද මුදල ජයග්‍රහණය කරන ලද මුළු ත්‍යාග සංඛ්‍යාව ප්‍රදානය කිරීම සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී ධන නිධානය ත්‍යාග සංචිත ගිණුමේ ඇති මුදල් හෝ වෙනත් ඕනෑම ත්‍යාග සංචිත ගිණුමක ඇති මුදල් හිඟ මුදල සපුරාලීම සඳහා උපයෝගී කරගනු ලැබිය යුතු ය ;

(ද) ජාතික ලොතරැයි මණ්ඩලයට අවශ්‍ය යැයි හැඟී ගියහොත්, ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන වෙනත් ජාතික ලොතරැයියක් සඳහා ත්‍යාග ලබා දීමට ධන නිධානය ත්‍යාග සංචිත ගිණුමේ ඇති මුදල් උපයෝගී කර ගැනීමට හිමිකම තිබිය යුතු ය ; සහ

(න) ඉහත ත්‍යාග ව්‍යුහය 2023 ජූලි මස 6 වැනි දිනට අදාළ දිනුම් ඇදීමේ අංකය 1197 සිට බලාත්මක වේ.

9. ජාතික ලොතරැයි මණ්ඩලය විසින්, ඉහත 2(උ) රීතියේ සඳහන් කර ඇති **NLB මෙගා මිලියන්ස්** ජාතික ලොතරැයිය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව මෙහෙයවනු ලැබිය යුතු ය :-

(1) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි දිනුම් ඇදීම් පැවැත්විය යුතුය.

(2) සෑම ටිකට්පතක් ම රුපියල් දහසකට (රු. 1,000/-) අලෙවි කරනු ලැබිය යුතු ය.

(3) සෑම ටිකට්පතක් ම එක් ත්‍යාගයක් හෝ ත්‍යාග වැඩි ප්‍රමාණයක් පමණක් දිනා ගැනීමට සුදුසුකම් ලැබිය යුතු ය.

(4) ටිකට්පත් ලක්ෂ තුනක් (300,000) අලෙවියට ඉදිරිපත් කළ යුතු ය.

(5) සෑම ටිකට් පතක ම පහත පරිදි අංක කාණ්ඩ පහක් ඇතුලත් කරනු ලැබිය යුතු අතර, එම කාණ්ඩ පහ සඳහා ත්‍යාග ප්‍රදානය කිරීමට වෙන් වෙන් වශයෙන් දිනුම් ඇදීම් සිදු කරනු ලබයි.

(අ) සුපිරි ත්‍යාගයේ දිනුම් අංකය

(ආ) මිලියනයේ දිනුම් අංකය

(ඇ) ලක්ෂයේ දිනුම් අංකය

(ඈ) දාහේ දිනුම් අංකය

(ඉ) විදෙස් සංචාර දිනුම් අංකය

(i) සුපිරි ත්‍යාගය දිනුම් ඇදීමේ අංක කාණ්ඩය අංක හයකින් සමන්විත වේ. සුපිරි ත්‍යාග දිනුම් අංක කාණ්ඩයේ පළමු අංකය බිංදුවේ සිට දෙක (0 - 2) දක්වා අංක පරාසය තුළ ඉදිරිපත් කරනු ලැබිය යුතුය. අනෙක් අංක පහෙන් සෑම අංකයක්ම අංක බිංදුවේ සිට අංක නවය (0 - 9) දක්වා අංක පරාසය තුළ ඉදිරිපත් කරනු ලැබිය යුතුය. (සෑම මුද්‍රිත ටිකට් පතක ම සම්මත අංක ආකෘතිය, තීරු කේත අංක ආකෘතිය සහ ක්ෂණික ප්‍රතිචාර කේත ආකෘතිය වශයෙන් ආකෘති තුනකින් අනුක්‍රමික අංකයක් ද අඩංගු විය යුතු ය.)

(ii) මිලියනයේ දිනුම් ඇදීමේ අංක කාණ්ඩය අංක හතරකින් සමන්විත වේ. මිලියනයේ දිනුම් අංක කාණ්ඩයේ පළමු අංකය බිංදුවේ සිට දෙක (0 - 2) දක්වා අංක පරාසය තුළ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අනෙක් අංක තුනෙන් සෑම අංකයක්ම බිංදුවේ සිට නවය(0 - 9) දක්වා අංක පරාසය තුළ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(iii) ලක්ෂයේ දිනුම් ඇදීමේ අංක කාණ්ඩය අංක හතරකින් සමන්විත වේ. ලක්ෂයේ දිනුම් අංක කාණ්ඩයේ පළමු අංක බිංදුවේ සිට දෙක (0 - 2) දක්වා අංක පරාසය තුළ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අනෙක් අංක තුනෙන් සෑම අංකයක්ම බිංදුවේ සිට නවය(0 - 9) දක්වා අංක පරාසය තුළ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(iv) දාහේ දිනුම් ඇදීමේ අංක කාණ්ඩය අංක දෙකකින් සමන්විත වේ. දාහේ දිනුම් අංක කාණ්ඩයේ පළමු අංකය බිංදුවේ සිට දෙක(0 - 2) දක්වා අංක පරාසය තුළ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අනෙක් අංකය බිංදුවේ සිට නවය (0 - 9) දක්වා අංක පරාසය තුළ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(v) විදේශ සංචාර දිනුම් ඇදීමේ අංක කාණ්ඩය අංක පහකින් සමන්විත වේ. විදේශ සංචාර දිනුම් අංක කාණ්ඩයේ පළමු අංක බිංදුවේ සිට දෙක (0 - 2) දක්වා අංක පරාසය තුළ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අනෙක් අංක තුනෙන් සෑම අංකයක්ම බිංදුවේ සිට නවය(0 - 9) දක්වා අංක පරාසය තුළ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(6) ත්‍යාග ප්‍රදානය පහත දැක්වෙන විධිවිධාන අනුගමනය කරමින් සිදු කරනු ලැබිය යුතු යඃ-

(අ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට පනස් අටක ප්‍රතිශතයක් (58%) ත්‍යාග ප්‍රදානය සඳහා වෙන් කරනු ලැබිය යුතු ය ;

(ආ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට විස්සක ප්‍රතිශතයක් (20%) නියෝජිත කොමිස් මුදල් සඳහා වෙන් කරනු ලැබිය යුතු ය (ටිකට්පත් බෙදාහැරීමේ නියෝජිත සඳහා 1.25% ක කොමිස් මුදලක් සහ අලෙවි නියෝජිත සඳහා 18.75% ක කොමිස් මුදලක්) ;

(ඇ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට දහයක ප්‍රතිශතයක් (10%) ඒකාබද්ධ අරමුදල සඳහා වෙන් කරනු ලැබිය යුතු ය;

(ඈ) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන මුදලින් සියයට දොළහක ප්‍රතිශතයක් (12%) ජාතික ලොතරැයි මණ්ඩලයෙහි 'මණ්ඩලයීය අරමුදල. සඳහා වෙන් කරනු ලැබිය යුතු ය ;

(ඉ) ටිකට්පතක ඇති සුපිරි ත්‍යාගය දිනුම් ඇදීමේ අංකයේ අංක හය, දිනුම් අදින ලද සුපිරි ත්‍යාග අංක හය සමග පිළිවෙලින් ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට්පතට රුපියල් මිලියන පනහක (රු. 50,000,000/-) සුපිරි ත්‍යාගයක් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඊ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති මිලියනයේ දිනුම් ඇදීමේ අංකයේ මිලියනයේ දිනුම් ඇදීමේ අංක හතර සමග පිළිවෙලින් දිනුම් අදින ලද අංක හතරක් සමග ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට් පතට රුපියල් මිලියනයක් (රු. 1,000,000/-) ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(උ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති එක් ලක්ෂයක දිනුම් ඇදීමේ අංකයේ ඕනෑම අංක හතරක් දිනුම් අදින ලද ඕනෑම අංක හතරක් සමග ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට් පතට රුපියල් එක් ලක්ෂයක් (රු. 100,000/-) ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඌ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති දාහේ දිනුම් ඇදීමේ අංකයේ දාහේ අංක දෙක සමග පිළිවෙලින් දිනුම් අදින ලද දාහේ අංක දෙක සමග ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට් පතට රුපියල් දහසක් (රු. 1,000/-) ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(එ) ටිකට්පත් එකක හෝ වැඩි ගණනක ඇති විදෙස් සංචාර දිනුම් ඇදීමේ අංකයේ අංක පහ දිනුම් අදින ලද විදෙස් සංචාර දිනුම් අංක පහ සමග පිළිවෙලින් ගැලපෙන අවස්ථාවක දී, එම ටිකට් පතට විදෙස් සංචාරයක් ප්‍රදානය කරනු ලැබිය යුතු ය ;

(ඒ) සෑම මුද්‍රිත ටිකට්පතක ම සම්මත අංක ආකෘතිය, තීරු කේත අංක ආකෘතිය සහ ක්ෂණික ප්‍රතිචාර කේත ආකෘතිය වශයෙන් ආකෘති තුනකින් අනුක්‍රමික අංකයක් ද අඩංගු විය යුතු ය.

(ඔ) ඒ අනුව ටිකට්පතේ පිටුපස දක්වා ඇති ත්‍යාග ව්‍යුහය පහත පරිදි වේ -

| ත්‍යාග ව්‍යුහය | | |
|---|---|---|
| සුපිරි ත්‍යාගය | සුපිරි ත්‍යාග අංකයේ ඉලක්කම් 6 ක අංක කාණ්ඩය නිවැරදි | රු. 50,000,000/- |
| මිලියනයේ ත්‍යාගය | මිලියනපති ත්‍යාග අංකයේ ඉලක්කම් 4 ක අංක කාණ්ඩය නිවැරදි | රු. 1,000,000/- බැගින් |
| ලක්ෂයේ ත්‍යාගය | ලක්ෂ එකක ත්‍යාග අංකයේ ඉලක්කම් 4 ක අංක කාණ්ඩය නිවැරදි | රු. 100,000/- බැගින් |
| දාහේ ත්‍යාගය | එක් දහසක ත්‍යාග අංකයේ ඉලක්කම් 4 ක අංක කාණ්ඩය නිවැරදි | රු. 1,000/- බැගින් |
| විදෙස් සංචාර ත්‍යාගය | විදෙස් සංචාර ඉලක්කම් 5 ක අංක කාණ්ඩය නිවැරදි | විදෙස් සංචාරය (රු. 400,000/- ක උපරිම සීමාව තුළ ජාතික ලොතරැයි මණ්ඩලයේ තීරණය පරිදි) |

(ඕ) දැනට පවතින සුපිරි ත්‍යාගය ජයග්‍රහණය කරනු ලැබුවේ නම්, ත්‍යාග සංචිත ගිණුම හෝ වෙනත් ඕනෑම ත්‍යාග සංචිත ගිණුමකින් රුපියල් මිලියන පනහකින් (රු. 50,000,000/-) නව සුපිරි ත්‍යාගයක් පිරිනමනු ඇත;

(ක) ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා වෙන් කර ඇති දළ ආදායමෙන් ලද සියයට පනස් අටක ප්‍රතිශතයෙන් (58%) යම් මුදලක් ඉතිරිව ඇති විටක දී, එකී ඉතිරිව ඇති අතිරික්ත / ඉතිරි මුදලින් සියයට සියයක ප්‍රතිශතය (100%) මුදල් පනතේ 17 වැනි වගන්තියේ (1අ) උපවගන්තියට අනුකූලව NLB මෙගා මිලියන්ස් ත්‍යාග සංචිත ගිණුමට බැර කරනු ලැබිය යුතු ය ;

(ග) ජාතික ලොතරැයි මණ්ඩලය NLB මෙගා මිලියන්ස් ලොතරැයි දිනුම් ඇදීමක දී ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා වෙන් කරන ලද මුදල ජයග්‍රහණය කරන ලද මුළු ත්‍යාග සංඛ්‍යාව ප්‍රදානය කිරීම සඳහා ප්‍රමාණවත් නොවන අවස්ථාවක දී "NLB මෙගා මිලියන්ස් " ත්‍යාග සංචිත ගිණුමේ ඇති මුදල් හෝ වෙනත් ඕනෑම ත්‍යාග සංචිත ගිණුමක ඇති මුදල් හිඟ මුදල සපුරාලීම සඳහා උපයෝගී කරගනු ලැබිය යුතු ය ;

(ච) ජාතික ලොතරැයි මණ්ඩලයට අවශ්‍ය යැයි හැඟී ගියහොත්, ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මෙහෙයවනු ලබන වෙනත් ජාතික ලොතරැයියක් සඳහා ත්‍යාග ලබා දීමට NLB මෙගා මිලියන්ස් ත්‍යාග සංචිත ගිණුමේ ඇති මුදල් උපයෝගී කර ගැනීමට හිමිකම තිබිය යුතු ය ; සහ

(ජ) ඉහත ත්‍යාග ව්‍යුහය 2023 දෙසැම්බර් මස 30 වැනි දිනට අදාළ දිනුම් ඇදීමේ අංකය 01 සිට බලාත්මක වේ.

10. ජාතික ලොතරැයි මණ්ඩලය විසින්, ඉහත 2(ඌ) රීතියේ සඳහන් කර ඇති **සෙවණ** සූරන ජාතික ලොතරැයිය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව මෙහෙයවනු ලැබිය යුතු ය :-

(1) ජයග්‍රහණය කරනු ලැබූ ත්‍යාග හඳුනා ගැනීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් සීරීමේ සහ ගැලපීමේ තාක්ෂණය අනුගමනය කරමින් අදාළ ලොතරැයියේ ත්‍යාග පිරිනැමිය යුතු ය.

(2) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ප්‍රවර්ධන ත්‍යාග, ඒ සඳහා පවත්වනු ලබන විශේෂ දිනුම් ඇදීමක් හරහා ප්‍රදානය කරනු ලැබිය හැකිය.

(3) ටිකට්පත් මිල කාණ්ඩ දෙකක් යටතේ අලෙවි කරනු ලබන අතර, එම ටිකට්පත් රුපියල් හතළිහ (රු. 40/-) සහ රුපියල් පනහ (රු. 50/-) යන මිල කාණ්ඩ යටතේ අලෙවි කරනු ලැබිය යුතු ය. එක් එක් ටිකට්පත් කාණ්ඩයක් සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ටිකට් පත් සංඛ්‍යාවක් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් අලෙවිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මුද්‍රිත ටිකට්පත් ඇසුරුමක අඩංගු ටිකට් පත් සංඛ්‍යාව තීරණය කරනු ලැබිය යුතුය.

(5) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන ආදායමෙන් සියයට හතලිස් නවයක ප්‍රතිශතයක (49%) සිට සියයට පනස් තුනක ප්‍රතිශතයක් (53%) දක්වා ත්‍යාග මුදල් පිරිනැමීම සඳහා වෙන් කරනු ලැබිය යුතුය. ජාතික ලොතරැයි මණ්ඩලය විසින් එක් එක් ලොතරැයියෙන් ලැබෙන ආදායමෙන් සියයට හතලිස් නවයක ප්‍රතිශතයක (49%) සිට සියයට පනස් තුනක ප්‍රතිශතයක්(53%) දක්වා පරාසයක් තුළ ත්‍යාග මුදල් තීරණය කරනු ලැබිය යුතුය.

(6) ටිකට් පත් අලෙවි කිරීමෙන් ලැබෙන ආදායමෙන් සියයට විස්සක ප්‍රතිශතයක් (20%) නියෝජිත කොමිස් මුදල් සඳහා වෙන් කරනු ලැබිය යුතු ය (ටිකට්පත් බෙදාහැරීමේ නියෝජිත සඳහා 1.25% ක කොමිස් මුදලක් සහ අලෙවි නියෝජිත සඳහා 18.75%ක කොමිස් මුදලක්);

(7) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන ආදායමෙන් සියයට දහයක ප්‍රතිශතයක් (10%) ඒකාබද්ධ අරමුදල හරහා අදාළ අරමුදලට වෙන් කරනු ලැබිය යුතුය;

(8) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන ආදායමෙන් සියයට දාහතක (17%) ප්‍රතිශතයේ සිට සියයට විසි එකේ (21%) පරාසය තුළ ජාතික ලොතරැයි මණ්ඩලයෙහි 'මණ්ඩලයීය අරමුදලට' වෙන් කරනු ලැබිය යුතුය;

(9) ටිකට්පත් දරන්නා විසින් ටිකට්පතෙහි ඇති සීරීම් පුවරුව ආවරණය කරනු ලබන ස්ථරය ඉවත් කරනු ලබන තෙක් ක්ෂණික ත්‍යාගය හඳුනාගත නොහැකි වන ආකාරයට ටිකට්පත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(10) ටිකට්පත් දරන්නෙකු ත්‍යාගයක් ජයග්‍රහණය කර තිබේද යන්න නිශ්චය කරනු ලබන්නේ කවර ආකාරයෙන් ද යන්න සහ එම ත්‍යාගය සඳහා ඉල්ලුම් කළ යුතු ආකාරය කුමක්ද යන්න සෑම ටිකට් පතක ම පැහැදිලිව සඳහන් කර තිබිය යුතු ය.

11. ජාතික ලොතරැයි මණ්ඩලය විසින්, ඉහත 2(එ) රීතියේ සඳහන් කර ඇති සමෘද්ධි සූරන ජාතික ලොතරැයිය මෙහි පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව මෙහෙයවනු ලැබිය යුතු ය :-

(1) ජයග්‍රහණය කරනු ලැබූ ත්‍යාග හඳුනා ගැනීම සඳහා ජාත්‍යන්තරව පිළිගත් සීරීමේ සහ ගැලපීමේ තාක්ෂණය අනුගමනය කරමින් අදාළ ලොතරැයියේ ත්‍යාග පිරිනැමිය යුතුය.

(2) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ප්‍රවර්ධන ත්‍යාග, ඒ සඳහා පවත්වනු ලබන විශේෂ දිනුම් ඇදීමක් හරහා ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(3) ටිකට්පත් මිල කාණ්ඩ දෙකක් යටතේ අලෙවි කරනු ලබන අතර, එම ටිකට්පත් රුපියල් හතළිහ (රු. 40/-) සහ රුපියල් පනහ (රු. 50/-) එක් එක් මිල කාණ්ඩ යටතේ අලෙවි කරනු ලැබිය යුතු ය. එක් එක් ටිකට්පත් කාණ්ඩයක් සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ටිකට්පත් සංඛ්‍යාවක් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් අලෙවිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(4) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මුද්‍රිත ටිකට්පත් ඇසුරුමක අඩංගු ටිකට්පත් සංඛ්‍යාව තීරණය කරනු ලැබිය යුතු ය.

(5) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන ආදායමෙන් සියයට හතළිස් නවයක ප්‍රතිශතයක (49%) සිට සියයට පනස් තුනක ප්‍රතිශතයක් (53%) දක්වා ත්‍යාග මුදල් පිරිනැමීම සඳහා වෙන් කරනු ලැබිය යුතු ය. ජාතික ලොතරැයි මණ්ඩලය විසින් එක් එක් ලොතරැයියෙන් ලැබෙන ආදායමෙන් සියයට හතළිස් නවයක ප්‍රතිශතයක (49%) සිට සියයට පනස් තුනක ප්‍රතිශතයක් (53%) දක්වා පරාසයක් තුළ ත්‍යාග මුදල් තීරණය කරනු ලැබිය යුතු ය.

(6) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන ආදායමෙන් සියයට විස්සක ප්‍රතිශතයක් (20%) නියෝජිත කොමිස් මුදල් සඳහා වෙන් කරනු ලැබිය යුතු ය (ටිකට්පත් බෙදාහැරීමේ නියෝජිත සඳහා 1.25% ක කොමිස් මුදලක් සහ නියෝජිතයකු සඳහා 18.75% ක කොමිස් මුදලක්);

(7) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන ආදායමෙන් සියයට දහයක ප්‍රතිශතයක් (10%) ඒකාබද්ධ අරමුදලට වෙන් කරනු ලැබිය යුතු ය ;

(8) ටිකට්පත් අලෙවි කිරීමෙන් ලැබෙන ආදායමෙන් සියයට දාහතක (17%) ප්‍රතිශතයේ සිට සියයට විසි එකේ (21%) පරාසය තුළ ජාතික ලොතරැයි මණ්ඩලයෙහි 'මණ්ඩලයීය අරමුදලට' වෙන් කරනු ලැබිය යුතු ය ;

(9) ටිකට් පත් දරන්නා විසින් ටිකට් පතෙහි ඇති සීරීම් පුවරුව ආවරණය කරනු ලබන ස්ථරය ඉවත් කරනු ලබනතෙක් ක්ෂණික ත්‍යාගය හඳුනාගත නොහැකි වන ආකාරයට ටිකට්පත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(10) ටිකට්පත් දරන්නෙකු ත්‍යාගයක් ජයග්‍රහණය කර තිබේද යන්න නිශ්චය කරනු ලබන්නේ කවර ආකාරයෙන් ද යන්න සහ එම ත්‍යාගය සඳහා ඉල්ලුම් කළ යුතු ආකාරය කුමක්ද යන්න සෑම ටිකට්පතක ම පැහැදිලිව සඳහන් කර තිබිය යුතු ය.

12. මෙම රීතිවල ඉහතින් වූ විධිවිධානවල කුමක් සඳහන් වුවද, එය නොතකා, යම් ජාතික ලොතරැයි දිනුම් ඇදීමක් පැවැත්වීම සඳහා පහත සඳහන් විධිවිධාන පොදුවේ අදාළ විය යුතු ය :-

(1) මෙම රීති මගින්, ජයග්‍රහණය කරනු ලබන ටිකට් පත් නිශ්චය කිරීම සඳහා නිශ්චිත ක්‍රමයක් හඳුන්වා දී නොමැති අවස්ථාවක දී, යම් ජාතික ලොතරැයි දිනුම් ඇදීමක් සලකුණු කරන ලද පන්දු හෝ අයිතම සමග බැරල් එකක් හෝ කිහිපයක් හෝ දිනුම් ඇදීමේ යන්ත්‍රයක්, නැතහොත් නවීන තාක්ෂණ ක්‍රමයක් යොදා ගනිමින් පවත්වනු ලැබිය යුතු ය.

(2) (අ) සූරන ලොතරැයිපත් නොවන මෙන්ම ක්ෂණික ත්‍යාග ප්‍රදානය කරනු නොලබන සෑම ජාතික ලොතරැයි පතකම පහත විස්තර සඳහන් කරනු ලැබිය යුතු ය :-

i) ලොතරැයියේ නම ;

ii) එක් ටිකට් පතක මිල ;

iii) කී වෙනි දිනුම් ඇදීමේ වාරය ද යන්න;

iv) දිනුම් ඇදීම පවත්වනු ලබන දිනය;

v) ජයග්‍රහණය කරනු ලැබූ ත්‍යාගය හඳුනා ගන්නා ආකාරය සහ ත්‍යාගයේ වටිනාකම;

vi) 'කිව්ආර් ' කේතය ; සහ

vii) 1963 අංක 11 දරන මුදල් (සංශෝධිත) පනතේ විධිවිධානවලට යටත්ව ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ලොතරැයිය පවත්වනු ලබන බව.

(ආ) ලොතරැයි දිනුම් ඇදීම ජාතික ලොතරැයි මණ්ඩලය විසින් තීරණය කරනු ලැබූ මැදිරියක දී හෝ ස්ථානයක දී පවත්වනු ලැබිය යුතු ය.

(ඇ) කිසියම් විශේෂිත හෝ නොවැළැක්විය හැකි තත්වයක් හේතුවෙන් ලොතරැයි පත්‍රයෙහි සඳහන් දිනට අදාළ ලොතරැයි දිනුම් ඇදීම පැවැත්වීමට ජාතික ලොතරැයි මණ්ඩලය හට නොහැකි වුවහොත්, ජාතික ලොතරැයි මණ්ඩලය විසින් එම ලොතරැයි දිනුම් ඇදීමේ නව දිනය මහජනතාව වෙත දැනුම් දිය යුතු ය.

(3) සූරන ලොතරැයිපත් වන මෙන්ම ක්ෂණික ත්‍යාග ප්‍රදානය කරනු ලබන සෑම ජාතික ලොතරැයි පතකම පහත විස්තර සඳහන් කරනු ලැබිය යුතු යඃ-

i) ලොතරැයියේ නම;

ii) එක් ටිකට් පතක මිල ;

iii) ටිකට් පත ත්‍යාගයක් ජයග්‍රහණය කර තිබේද යන්න නිශ්චය කරනු ලබන ආකාරය ත්‍යාගයේ වටිනාකම හෝ භාණ්ඩ ත්‍යාගය සහ ත්‍යාගය ලබා ගැනීම සඳහා ඉල්ලුම් කළ යුතු ආකාරය ;

iv) 'කිව්ආර්' කේතය ; සහ

v) 1963 අංක 11 දරන මුදල් (සංශෝධිත) පනතේ විධිවිධානවලට යටත්ව ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ලොතරැයිය පවත්වනු ලබන බව.

(4) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් දිනුම් අදින ලද ලොතරැයි ප්‍රතිඵල සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන් ජාතික ලොතරැයි මණ්ඩලයේ නිල වෙබ් අඩවියේ හා අනෙකුත් මාධ්‍යයන්හි, ජාතික ලොතරැයිවල ජයග්‍රාහී අංකය හෝ අංක, අක්ෂර හෝ අක්ෂරය, සලකුණ හෝ සලකුණු ඒවායේ ත්‍යාග මුදල් හෝ භාණ්ඩවල වටිනාකම සහ අවශ්‍ය යැයි සලකනු ලැබුවහොත් වෙනත් යම් තොරතුරු ද පළ කරනු ලැබිය යුතු ය. ජයග්‍රහකයන්ගේ නම් සහ ලිපිනයන් පළ කිරීමේ අයිතිය ජාතික ලොතරැයි මණ්ඩලය සතු වනු ඇත.

(5) ඉරුණු හෝ විරූපී වී තිබෙන ටිකට්පත් ලොතරැයි ත්‍යාගයක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කිරීම පිණිස සුදුසුකම් නොලබන්නේය. එසේ වුවද එවැනි ටිකට්පත් දරන්නන් විසින් ජාතික ලොතරැයි මණ්ඩලය වෙත වියදම් ගෙවීම මගින් එම ටිකට්පත් රජයේ පිළිගත් සැක කටයුතු ලේඛන පිළිබඳ පරීක්ෂකවරයෙකු හෝ වෙනත් යම් නිපුණ තැනැත්තකු මගින් අව්‍යාජ ටිකට් පත් බවට සහතික කරවා ගෙන එම ටිකට් පත් ත්‍යාග මුදල් ප්‍රදානය කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(6) මුද්‍රණය කරනු ලබන සියලුම ටිකට් පත් සහ ඩිජිටල් අලෙවිය සඳහා ඉදිරිපත් කරනු ලබන සියලුම ටිකට්පත් ලොතරැයි වර්ගය වශයෙන් අලෙවිය සඳහා ඉදිරිපත් කළ යුතු ය. ටිකට් පතේ සඳහන් කර ඇති මුදලට පමණක් ටිකට් පත් අලෙවි කරනු ලැබිය යුතු ය. එක් එක් දිනුම් ඇදීමට පෙර අලෙවිය සඳහා ඉදිරිපත් කළ සියලුම ටිකට්පත් අතුරින් අලෙවි නොකරන ලද සියලුම ටිකට් පත් අවලංගු කිරීම සඳහා එම ටිකට් පත් ලේඛනගත කර රජයේ විගණකවරුන් විසින් සහතික කරනු ලැබිය යුතු ය.

(7) ටිකට් පතක මුද්‍රණ දෝෂයක් ඇති බවට සොයා ගනු ලැබුවේ නම් එම ටිකට් පත මිලදී ගත් පාරිභෝගිකයාට එම ටිකට් පතේ සඳහන් වටිනාකමට සමාන වන අලුත් ටිකට් පතක් හිමි වන්නේ ය.

(8) යම් ජාතික ලොතරැයියක ටිකට් පත් අලෙවිය ඉහළ නැංවීමේ අරමුණ ඇතිව, යම් ජාතික ලොතරැයියක ටිකට් පත්වල සඳහන්ව ඇති අනුක්‍රමික අංකය හෝ වෙනත් යම් අංකයක් හෝ ඉංග්‍රීසි අක්ෂරයක් හෝ සලකුණක් සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය විසින් කලින් කලට පවත්වනු ලබන සාමාන්‍ය හෝ විශේෂ දිනුම් ඇදීමක් මගින් පාරිභෝගික ප්‍රවර්ධන ත්‍යාග වශයෙන් අතිරේක ත්‍යාග ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(9) ජාතික විගණන කාර්යාලයේ නියෝජිතයකු, ජාතික ලොතරැයි මණ්ඩලයෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු හෝ මණ්ඩලයේ මධ්‍යම කළමනාකරණ ගණයට හෝ ඉහළ කළමනාකරණ ගණයට අයත් නිලධරයකු සහ ජ්‍යෙෂ්ඨ සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ නොවන තනතුරක් දරනු ලබන පොලිස් නිලධරයකුගෙන් සමන්විත වන්නා වූ (මෙහි මින්මතු "අධීක්ෂණ මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධීක්ෂණ මණ්ඩලයක් ඉදිරියේ දිනුම් ඇදීම පවත්වනු ලැබිය යුතු ය. ජාතික ලොතරැයි මණ්ඩලයෙහි තීරණය පරිදි අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක හෝ රජය සතු ව්‍යවසායක ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරියෙකු අධීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් වනු ඇත.

(10) දිනුම් ඇදීම සඳහා යොදාගනු ලබන උපකරණය ක්‍රියාත්මක වන ආකාරය අනුව ජයග්‍රහණය කරනු ලබන අංකය හෝ අක්ෂරය හෝ සලකුණ දිනුම් අදිනු ලැබිය යුතු අවස්ථාව ජාතික ලොතරැයි මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් තීරණය කරනු ලැබිය යුතු ය. එවැනි තීරණයක් ගනු ලැබූ විට ජයග්‍රාහී අංකය හෝ අක්ෂරය හෝ සලකුණ නීත්‍යානුකූලව තෝරාගනු ලැබූ අංකය හෝ අක්ෂරය හෝ සලකුණ වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(11) ඩිජිටල් තාක්ෂණය භාවිතයෙන් ලොතරැයි දිනුම් ඇදීම සඳහා භාවිතා කරන පරිගණක පද්ධතිය, ජාතික විගණන කාර්යාලය නියෝජනය කරන අධීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයා විසින් පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(12) දිනුම් ඇදීමේ කාර්යය සඳහා අංක හෝ අක්ෂර හෝ සලකුණ සටහන් කරන ලද අයිතම දිනුම් ඇදීමෙන් පසුව ආරක්ෂිත පෙට්ටියක බහා, එම පෙට්ටිය ජාතික විගණන කාර්යාලය නියෝජනය කරන අධීක්ෂණ මණ්ඩල සාමාජිකයා සහ ජාතික ලොතරැයි මණ්ඩලයීය මාණ්ඩලික නිලධාරියකු ඉදිරියේ අගුළු දමා ආරක්ෂිත ස්ටිකරයක් අලවා මුද්‍රා තැබිය යුතු ය. එම අයිතම අඩංගු පෙට්ටිය ජාතික විගණන කාර්යාලය නියෝජනය කරන අධීක්ෂණ මණ්ඩල සාමාජිකයා හා ජාතික ලොතරැයි මණ්ඩලයීය මාණ්ඩලික නිලධාරියෙකු ඉදිරියේ දී විවෘත කරනු ලැබිය යුතු ය. එම පෙට්ටියේ යතුර ජාතික ලොතරැයි මණ්ඩලය හි සභාපතිවරයා විසින් නම් කරනු ලබන විධායක නිලධරයකු භාරයේ තැබිය යුතු ය.

(13) දිනුම් ඇදීමෙහි පටිගත කිරීම, එය රූපවාහිනිය මඟින් හෝ වෙනත් ඩිජිටල් මාධ්‍යයක විකාශනය කරනු ලබන තෙක් ආරක්ෂිත භාරයක තැබීම සඳහා වැඩපිළිවෙලක් සකස් කර තිබිය යුතු ය. ජාතික ලොතරැයි මණ්ඩලයෙහි සභාපතිවරයා විසින් ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන් සඳහා අනුගමනය කළ යුතු ප්‍රායෝගික විධිවිධාන පිළිබඳව තීරණය කරනු ලැබිය යුතු ය. ලොතරැයි දිනුම් ඇදීමේ වැඩසටහන්වල රාජකාරි ඉටු කරන අදාල නිලධාරීන් වෙත සිදු කළ යුතු ගෙවීම් ජාතික ලොතරැයි මණ්ඩලයේ පාලන අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

(14) ලොතරැයි දිනුම් ඇදීම සම්බන්ධයෙන් යොදා ගනු ලබන සියලුම අංක සහ අක්ෂර සහ සලකුණු ඇතුළත් දිනුම් ඇදීමේ අයිතම එම ද්‍රව්‍යවල විශ්වසනීයත්වය සඳහා සාධාරණ වශයෙන් අවශ්‍ය වන්නා වූ සමරූපීභාවයෙන් යුක්ත වන්නේ ද යන්න තහවුරු කර ගැනීම සඳහා පිළිගත් ප්‍රමිති ආයතනයක් මඟින් නිසි පරිදි පරීක්ෂා කරනු ලැබිය යුතු ය.

(15) ජාතික ලොතරැයි මිලදී ගැනීම සඳහා වයස අවුරුදු දහ අටට (18) වඩා අඩු කිසිදු තැනැත්තකු සුදුසුකම් නොලබන අතර, එවැනි හිමිකම් පෑමක් ඉදිරිපත් වූ විට ජාතික ලොතරැයි මණ්ඩලය විසින් කිසිදු ගෙවීමක් සිදු නොකළ යුතු ය.

(16) ජයග්‍රාහී ටිකට් පතක් සතුව සිටින ටිකට් පතෙහි පිටුපස ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ඉල්ලා සිටින තොරතුරු නිසි ලෙස පුරවා ඇති තැනැත්තෙකුට, අදාළ ත්‍යාග ව්‍යුහය අනුව ත්‍යාගයක් ලැබීමට හිමිකම් තිබිය යුතු ය. දිනුම් ඇදීම පවත්වන දිනයේ සිට මාස හයක (06) කාලසීමාවක් දක්වා ත්‍යාග වලංගුව පවතී. එම අදාළ කාලසීමාව තුළදී හිමිකම් ඉදිරිපත් නොකරනු ලබන ත්‍යාග රාජසන්තක කළ යුතු ය.

(i) නියමිත ලොතරැයි දිනුම් ඇදීම අවසන් වූ දින සිට මාස හයක (06) කාලසීමාවක් ඉකුත් වූ පසුව, ජාතික ලොතරැයියක ප්‍රධාන දිනුම් ඇදීමෙන් කිසියම් ජයග්‍රාහී මුදල් ත්‍යාගයක් හිමිකරගත් පුද්ගලයා හමු නොවීම හේතුවෙන් එම තැනැත්තා වෙත ත්‍යාග මුදල ප්‍රදානය කරනු ලැබ නොමැති නම්, එම ත්‍යාග මුදල රාජසන්තක කරනු ලැබිය යුතු අතර, ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු වේ.

(ii) නියමිත ලොතරැයි දිනුම් ඇදීම අවසන් වූ දින සිට මාස හයක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව, ජාතික ලොතරැයියක ප්‍රධාන දිනුම් ඇදීමෙන් කිසියම් ජයග්‍රාහී මුදල් නොවන ත්‍යාගයක් හිමිකරගත් පුද්ගලයා ඉදිරිපත් නොවීම හේතුවෙන් එම තැනැත්තා වෙත ත්‍යාගය ප්‍රදානය කරනු ලැබ නොමැති නම්, එම ත්‍යාගය හිමිකම් නොපෑ ත්‍යාගයක් ලෙස සලකා ජාතික ලොතරැයි මණ්ඩලයෙහි මුදල් නොවන ත්‍යාග තොගයට එකතු කරනු ලැබිය යුතු ය.

(iii) නියමිත ලොතරැයි දිනුම් ඇදීම අවසන් වූ දින සිට මාස හයක කාලසීමාවක් ඉකුත්වීමෙන් පසුව, ජාතික ලොතරැයියක කිසියම් ජයග්‍රාහී පාරිභෝගික ප්‍රවර්ධන මුදල් / මුදල් නොවන ත්‍යාගයක් හිමිකරගත් පුද්ගලයා ඉදිරිපත් නොවීම හේතුවෙන් එම තැනැත්තා වෙත එකී ත්‍යාගය ප්‍රදානය කරනු ලැබ නොමැති නම්, එම ත්‍යාගය හිමිකම් නොපෑ ත්‍යාගයක් ලෙස සලකා, එය මණ්ඩලයෙහි ත්‍යාග සංචිත ගිණුමට / ත්‍යාග තොගයට නැවත එකතු කරනු ලැබිය යුතු ය.

(17) (i) වර්තමානයේ පවතින ලොතරැයියක් නතර කිරීමේ පරම අයිතිය ජාතික ලොතරැයි මණ්ඩලය සතු වනු ඇත. පවතින ලොතරැයියේ සුපිරි ත්‍යාගය දිනාගෙන නොමැති නම්, එය නැවත මණ්ඩලයේ ත්‍යාග සංචිත ගිණුමට එකතු කරනු ලැබිය යුතු ය.

(ii) වර්තමානයේ පවතින ලොතරැයියක් නව ව්‍යුහයකින් ඉදිරිපත් කිරීමේ පරම අයිතිය ජාතික ලොතරැයි මණ්ඩලය සතු වනු ඇත. පවතින ලොතරැයියේ සුපිරි ත්‍යාගය දිනාගෙන නොමැති නම්, නැවත ඉදිරිපත් කරනු ලබන ලොතරැයියේ නව සුපිරි ත්‍යාගය එම සුපිරි ත්‍යාගයෙන් ආරම්භ කිරීම හෝ එම සුපිරි ත්‍යාගය ත්‍යාග සංචිත ගිණුම භාවිතා කර ඉහල දමනු ලැබීම හෝ පවතින සුපිරි ත්‍යාගය නැවත ත්‍යාග සංචිත ගිණුමට මාරු කර ත්‍යාග සංචිත ගිණුම භාවිතයෙන් නව සුපිරි ත්‍යාගයක් පිරිනැමීම හෝ සිදු කළ හැකි ය.

13. ජාතික ලොතරැයි අලෙවි කිරීම සඳහා පහත රීති අදාළ විය යුතු ය :-

(1) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් මුද්‍රිත ටිකට් පත් තුළින් කරනු ලබන අලෙවියට අමතරව, ජාතික ලොතරැයි ටිකට් පත් අලෙවි කිරීමේ කාර්යය සඳහා කෙටි පණිවුඩ සේවය (SMS) සහ අන්තර් ක්‍රියාකාරී හඬ හඳුනා ගැනීම (IVR), ජංගම යෙදුම්, වෙබ් සහ ඉලෙක්ට්‍රොනික උපාංග (මින් මතු "ඩිජිටල් මාධ්‍යයන්" ලෙස හඳුන්වනු ලබන) ද භාවිතයට ගනු ලැබිය හැකි ය.

(2) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ලොතරැයි ටිකට් පත් අලෙවි කිරීම සඳහා ඩිජිටල් මාධ්‍යයන් සපයනු ලබන ඩිජිටල් අලෙවිකරුවන් තෝරා ගැනීමට හැකි අතර, එම ඩිජිටල් අලෙවිකරුවන් ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ ගිවිසුම්වලට එළඹිය යුතු ය.

(3) ජාතික ලොතරැයි මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන සහ 13(2) රීතිය යටතේ ඇතුලත් වූ ගිවිසුමෙහි නිශ්චිතව දක්වා ඇති යම් කොමිස් මුදලක් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් එසේ ලබාගත් සේවාවන් සඳහා එම ඩිජිටල් අලෙවිකරුවන් වෙත ගෙවිය යුතු ය.

(4) 13(2) රීතිය යටතේ සඳහන් කර ඇති ඩිජිටල් අලෙවිකරු විසින් ජාතික ලොතරැයි මණ්ඩලය, ජංගම දුරකථන සේවා සැපයුම්කරුවන්, ජංගම දුරකථන පරිශීලකයින් සහ ඩිජිටල් සේවා සැපයුම්කරුවන් සමඟ සම්බන්ධීකරණය පවත්වා ගත යුතුය. ඩිජිටල් අලෙවිකරු විසින් දෝෂ රහිත මෙහෙයුමක් සිදු වන බවට සහතික කළ යුතු අතර, මෙහෙයුම සිදු වන අවස්ථාවේ දී දෝෂ සහ අතපසුවීම් සිදු වන්නේ නම්, ඒ සඳහා වගකිව යුතුය.

(5) ජාතික ලොතරැයි සඳහා දැනට පවතින ත්‍යාග ව්‍යුහයන්ට අනුකූලව ජයග්‍රාහකයන් සඳහා ත්‍යාග මුදල් ප්‍රදානය කරනු ලැබිය යුතු ය.

(6) ඩිජිටල් මාධ්‍යයන් මගින් පරිගණකගත දිනුම් ඇදීමේ ලොතරැයි ටිකට් පත් අලෙවි කිරීමේ අරමුණ සඳහා, එක් එක් ජාතික ලොතරැයි දිනුම් ඇදීමේ මූලික දත්ත සමුච්චයෙන් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන දත්ත සමුදාය/පරාසයක් එක් එක් ජාතික ලොතරැයි දිනුම් ඇදීමක් වෙනුවෙන් ඩිජිටල් අලෙවිකරු වෙත වෙන් කර දෙනු ලැබිය යුතු ය.

(7) ඩිජිටල් අලෙවි නියෝජිත විසින් ගිවිසුම්වලට අනුකූලව ඩිජිටල් අලෙවි නියෝජිත වෙත හිමිවිය යුතු කොමිස් මුදල් අඩු කිරීමෙන් පසුව එම ඩිජිටල් අලෙවි නියෝජිත වෙත වෙන් කරනු ලැබූ අංක පරාසය තුළ ටිකට් පත් විකිණීමෙන් ලබන මුදල් ජාතික ලොතරැයි මණ්ඩලය වෙත ගෙවිය යුතු ය.

ඩිජිටල් අලෙවි නියෝජිත විසින් විකුණුම් සහ අලෙවි ප්‍රවර්ධන උපාය මාර්ගයක් වශයෙන් ජාතික ලොතරැයි මණ්ඩලයේ අනුමැතියෙන් කලින් කලට නිශ්චය කරනු ලබන සැනසිලි ත්‍යාග ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(8) ඩිජිටල් මාධ්‍යයක් හරහා මිලදී ගත් ජාතික ලොතරැයියක් සඳහා ත්‍යාගයක් හිමිව තිබෙන අවස්ථාවක එහි සත්‍ය හිමිකරු සහ අවසාන පරිශීලකයා එකිනෙකාගෙන් වෙනස් පුද්ගලයන් දෙදෙනෙකු වන්නේ නම්, එවන් අවස්ථාවක නම සහ ජාතික හැඳුනුම්පත් අංකය සහිතව ඩිජිටල් අලෙවි නියෝජිත සමඟ ලියාපදිංචි වී ඇති පුද්ගලයාට, එම ත්‍යාග මුදල ගෙවනු ලැබිය යුතු ය.

(9) ඩිජිටල් මාධ්‍යයක් හරහා මිලදී ගත් ලොතරැයියක් සඳහා ත්‍යාගයක් හිමිව තිබෙන අවස්ථාවක, ඩිජිටල් අලෙවි නියෝජිත විසින් එම ත්‍යාග මුදල ලියාපදිංචි පාරිභෝගිකයාගේ විද්‍යුත් පසුම්බියට හෝ වෙනත් ඩිජිටල් මාධ්‍යයකට මාරු කරනු ලබයි.ලියාපදිංචි පාරිභෝගිකයාගේ විද්‍යුත් පසුම්බියට හෝ වෙනත් ඕනෑම ඩිජිටල් මාධ්‍යයකට මාරු කරනු ලබන අවම ත්‍යාග මුදල ජාතික ලොතරැයි මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු ය.ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ඩිජිටල් අලෙවි නියෝජිත වෙත යොමු කරන ලද ජයග්‍රාහී ත්‍යාගවල දින මත පදනම් වූ ත්‍යාග ලැයිස්තුව සහ අනුක්‍රමික අංක මත පදනම්ව ඩිජිටල් අලෙවි නියෝජිත විසින් ජයග්‍රාහී ත්‍යාග මුදල ලියාපදිංචි පාරිභෝගිකයාගේ විද්‍යුත් පසුම්බිය වෙත මාරු කරනු ලැබිය යුතුය.

(10) ඩිජිටල් මාධ්‍ය මඟින් මිලදී ගන්නා ලද ලොතරැයි ටිකට්පත්වල ජයග්‍රහණය හිමිකර ගත් ත්‍යාගලාභීන්ට මුදල් ගෙවීම සම්බන්ධයෙන් ඩිජිටල් වේදිකා සමඟ සම්බන්ධීකරණය කිරීම සහ මෙම මෙහෙයුම ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය සමඟ එකඟ වී සිටින ඩිජිටල් අලෙවි නියෝජිතගේ වගකීම වන්නේ ය.

(11) ජයග්‍රාහකයන්, කලින් කලට පනවනු ලබන රජයේ බදු වලට යටත් විය යුතු ය.

(12) ඩිජිටල් මාධ්‍ය මඟින් ලොතරැයි අලෙවි කිරීම සඳහා වෙන් කරනු ලැබ ඇති අංක පරාසය සම්බන්ධයෙන් බාගත කිරීමට අපොහොසත් වීම, අනපේක්ෂිත විදුලි විසන්ධි වීම හෝ ඒ ස්වභාවයේ වෙනත් කලින් අපේක්ෂා කළ නොහැකි ක්‍රියා පිළිබඳ ගැටලුවක් පවත්නා විට ජාතික ලොතරැයි මණ්ඩලය හට එදිනට නියමිත දිනුම් ඇදීම් පවත්වනු හැකි වනු පිණිස ඩිජිටල් මාධ්‍ය මඟින් ලොතරැයි අලෙවි කිරීමට වෙන් කරනු ලැබ ඇති එම අංක පරාසය අවලංගු කිරීමේ අයිතිය ජාතික ලොතරැයි මණ්ඩලය සතු වන්නේ ය. එසේ වුවද, එම අවලංගු කිරීම මත බලපෑමට ලක් වූ මිලදී ගන්නන් හට අවලංගු කරන ලද ටිකට්පත්වල අලෙවි වටිනාකමට සමාන නව ටිකට් පත් මුදල් ගෙවීමකින් තොරව ලබා ගැනීම සඳහා අවසර ලබා දිය යුතු ය.

(13) ජාතික ලොතරැයි ටිකට්පත් මිලදී ගන්නන්, ජාතික ලොතරැයි මණ්ඩලය සහ ඩිජිටල් අලෙවි නියෝජිත සහ ජංගම දුරකථන මෙහෙයුම්කරුගේ සියලුම රීති හා කොන්දේසිවලට යටත් විය යුතු ය.

14. 2013 ජනවාරි මස 31 දිනැති අංක 1795/37 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2011 (අංක 01) දරන ජාතික ලොතරැයි මණ්ඩල රීති, ඒ යටතේ නිසි පරිදි සිදු කරන ලද කිසිවකට අගතියක් තොරව මෙයින් අවලංගු කරනු ලැබේ.

15. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ රීති වල -

"මුදල් පනත" යන්නෙන් 1963 අංක 11 දරන මුදල් (සංශෝධිත) පනත අදහස් වේ ;

"ජාතික ලොතරැයි මණ්ඩලය" යන්නෙන් 1963 අංක 11 දරන මුදල් පනත යටතේ පිහිටුවන ලද ජාතික ලොතරැයි මණ්ඩලය අදහස් වේ ;

"ජාතික ලොතරැයිය" යන්නෙන් මුදල් පනතෙහි 14(1) වගන්තිය යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පවත්වනු ලබන ලොතරැයියක් අදහස් වේ.

EOG 06 - 0044

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.